# 2015

## වාර්ෂික වාර්තාව

ස්ථාවරත්වය හා අවධානය

LECO සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම



LECO

# සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම සහ එහි නියෝජිතායතන

මූල්‍ය ප්‍රකාශන

2015 දෙසැම්බර් 31



## අපගේ දැක්ම

නව්‍ය, පරිසර හිතකාමී ව්‍යාපාරය තුළින් ජනජීවිතය එළිය කරමින් සතුට දැනවීම.

## අපගේ මෙහෙවර

අඛණ්ඩ නව්‍යකරණය මගින් වඩාත් යහපත් බලශක්ති විසඳුම් සමාජයට අත්කර දීම.

## අපගේ වටිනාකම්

ඵලදායිත්වය වර්ධනය තුඩුදෙන පරිසර විද්‍යාත්මක තිරසාර වටපිටාවක් තුළ බෙදුම් සේවා නව්‍යකරනය කරමින් හා වැඩිදියුණු කරමින් නිරන්තර කුතූහලය නිසා ලබා දෙන නව්‍ය සේවා මගින් අපගේ පාරිභෝගිකයන් විස්මිත කිරීම හා හැකියාවන් සහිත හා තෘප්තිමත් කාර්ය මණ්ඩලයක් මගින් ලාභදායිත්වය ඇති කිරීම.



# අපේ වර්ධනාත්මක ගමන්මඟ

තම මූලාරම්භයේ සිටම ඉහළ පාරිභෝගික තෘප්තියක් සහිතව, වසරින් වසර කදිම සැපයුම් ඝණත්වය හා තිරසාරත්වය තුළ ලාභදායිත්වය වඩවමින් ව්‍යාපාරික කාර්යසාධනයේ කැපී පෙනෙන වැඩිදියුණුවක් ලැබීම දැනුම්දීම ලංකා විදුලි සමාගමට ආඩම්බරයකි.

## ප්‍රධාන කාර්යසාධනයන්

### විදුලි අලෙවි ආදායම




### බදු හා විලම්බිත බදු වලින් පසු ලාභය/ පාඩුව




### සේවක සංඛ්‍යාව




### ලෙකෝ පාරිභෝගික සංඛ්‍යාව






# පටුන

| | |
|---|---|
| ආයතනික තොරතුරු | 10 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 11 |
| සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය | 12 |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 14 |
| අධ්‍යක්ෂක වාර්තාව | 17 |
| ආයතනික පරිපාලනය | 20 |
| ඉංජිනේරු අංශය | 21 |
| මානව සම්පත් හා පරිපාලන | 22 |
| අභ්‍යන්තර විගණන කණ්ඩායම | 24 |
| ජ්‍යේෂ්ඨ කළමනාකාරීත්වය | 25 |
| මෙහෙයුම් අංශය | 26 |
| මූල්‍ය විමසුම | 28 |
| ස්වාධීන විගණක වාර්තාව | 30 |
| මූල්‍ය තත්ව ප්‍රකාශනය | 32 |
| ලාභාලාභ ප්‍රකාශනය | 33 |
| විස්තීරන ආදායම | 34 |
| සමකොටස් වෙනස්වීමේ ප්‍රකාශනය | 35 |
| මුදල් ගලන ප්‍රකාශනය | 36 |
| මූල්‍ය ප්‍රකාශනවල සටහන් | 38-70 |
| ප්‍රධාන කාර්යසාධනයන් | 72 |



එල්ල කර ඇති ඕනෑම
ඉලක්කයක් කරා හඹා යාමට
සූදානමින්, දුනු ලණුවට
තදින් සවි වී ඇති දුන්න!
ලෙකෝහි අද තත්වය
ඊට සමානය.
අපි අප ස්ථාවරත්වයක් හා
ශක්තිමත් බවක් ලබා ඇති අතර,
අපගේ තෝරාගත් ඉලක්කවලට
යොමු වීමට සූදානමින් පසු වෙමු.

**අපගේ අනාගත සැළසුම් සඳහා ඉලක්ක පහක් අප හඳුනා ගෙන ඇත.** **LECO**

# ආයතනික තොරතුරු

**සී/ස. ලංකා විදුලි (පෞද්ගලික) සමාගම**

**නෛතික ව්‍යුහය**

1982 අංක 17 දරන හා 2007 අංක 7 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1983 දී සංස්ථාගතකරන ලද සීමාසහිත බැරකම් ඇති පෞද්ගලික සමාගමකි.

**2015.12.31 දිනට සමාගමේ නිලයන් හෙබවූ අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දක්වා ඇත.**

| | |
|---|---|
| කේ.ආර්.එච්.එල්. ගුණසේකර මයා (සභාපති) | 2015 නොවැම්බර් 17 දින සිට පත්කළ |
| ඩබ්.ඩී.ඒ.එස්. විජයපාල මයා | 2015 ජනවාරි 27 දින සිට පත්කළ |
| එම්.සී. වික්‍රමසේකර මයා | 2015 ජනවාරි 27 දින සිට පත්කළ |
| පී. අල්ගම මයා | 2015 අප්‍රේල් 07 දින සිට පත්කළ |
| ඩී.එස්.පී.කේ. කරුණාසේකර මයා | 2015 නොවැම්බර් 16 දින සිට පත්කළ |

- පී.කේ.ඒ.ඩී. ද සිල්වා මිය 2015 ජනවාරි 20 වන දින ඉල්ලා අස්වූ අතර ඒ වෙනුවට 2015 අප්‍රේල් 07 වන දින සිට පී. අල්ගම මහතා පත් කෙරිනි.
- ජේ. එම්.වී.පී. ජයසූරිය මහතාව 2016.01.13 දින පත් කෙරිනි.

**උප ආයතනවල අධ්‍යක්ෂවරුන්ගේ නම් - 2015.12.31 දිනට**

සී/ස ඇන්ටෙ ලෙකෝ මීටරින (පෞද්ගලික) සමාගම

- එම්.සී. වික්‍රමසේකර මයා
- ලියූ ජියාන්වු මයා
- ෂෙන් ඩිංගිං මයා
- එච්.එන්. ගුණසේකර මයා

**සමාගම් ලේකම්වරු**

සී/ස පී.ඩබ්. කෝපරේට් සෙක්‍රටරියල් (පෞද්ගලික) සමාගම
අංක 3/17, කිංසි පාර, කොළඹ 8

**ලියාපදිංචි කාර්යාලය**

411, ගාලු පාර
ඊ.එච්. කුරේ ගොඩනැගිල්ල කොළඹ 3

**බැංකුකරුවෝ**

ලංකා බැංකුව
ලංකා කොමර්ෂල් බැංකුව PLC
හැටන් නැෂනල් බැංකුව PLC
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව PLC
මහජන බැංකුව
සම්පත් බැංකුව PLC
සෙලාන් බැංකුව PLC
ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
ජාතික සංවර්ධන බැංකුව PLC
සී/ස ද හොංකොං ඇන්ඩ් ෂැන්හයි බෑන්කිං කෝපරේෂන් (HSBC)
ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB)
DFCC වර්ධන බැංකුව PLC
සිටි බෑන්ක් N.A
පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් PLC
කොළඹ යූනියන් බැංකුව PLC
සී/ස NSB අරමුදල් කළමනාකරණ සමාගම





# සභාපතිතුමාගේ පණිවුඩය



'ලෙකෝ' හි දසවන සභාපතිවරයා ලෙස, අපගේ මාහැඟි කොටස්කරුවන් සමාගමේ 33 වන වාර්ෂික මහා සභා රැස්වීම ට උණුසුම්ව පිළගැනීමට මම කැමැත්තෙමි.

ජාතිය ගොඩනැඟීමේදී සහ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාවේ වත්මන් හා ඉදිරි ගමන සඳහා මාවත විවර කරගැනීමට දායක වනු පිණිස, 2015 නොවැම්බර් 23 වන දින ලංකා විදුලි සමාගම හා එක් වීමට හැකිවීම වරප්‍රසාදයක් ලෙස මා සලකමි. රජයේ බලශක්ති ප්‍රතිපත්තියට අනුකූලව, සුහුරු මනුකරණයක් (SMART MEETERING), ඒහා සම්බන්ධිත තාක්ෂණයක් යොදා ගැනීමට 'ලෙකෝ' කටයුතු කර ඇත. මෙම ප්‍රයත්නයේදී, වර්තමාන සභාපතිවරයා ලෙස මාගේ දායකතවය ලබාදීමට අවස්ථාව උදා වීම පිළිබඳව මම ආඩම්බර වෙමි.

වසර ගණනාවක් තුළදී අතිදැවැන්ත වර්ධනයක් අත්කර ගැනීමටත්, රටේ ප්‍රධාන උපයෝගීතා ලබා දීමටත් ලෙකෝ'ට හැකි විය. ආරම්භයේ සිට දශක තුනකට පසුව, තම පාරිභෝගි කයන්ට ගුණාත්මක හා විශ්වාසදායී සේවාවක් ලබා දීමට ලෙකෝ උත්සුකවීම හා ඒ සඳහා ක්‍රියා කිරීමට ලෙකෝ'ට හැකිවීම යනු එහි පදනම කදිමව යොදා ඇති බවට් සාක්ෂ්‍යයකි.

2015 වසර තුළ රු. බිලියන 1.3 ක ලාභයක් ලබා ගැනීමට සමූහ ව්‍යාපාරය කටයුතු කිරීම පැසසිය යුතුය.

අංශයන්හි ක්‍රියාකාරකම් පිළිබඳව විස්තරාත්මක වාර්තා විශේෂිත ජේද වල දක්වා ඇත.

"දීර්ඝතම ගමනවුව ඇරඹෙන්නේ එක් පියවරකිනි" යන කියමනට අනුව, වසර 1983 ඇරඹුණු ලෙකෝ ගමන තවමත් අවසන්වී නොමැති අතර, තව දුර යා යුතුව ඇත. මෙහිදී අභියෝග රැසක් තිබෙනවා වුවද තවත් අනාගත කාලයක් පුරා ලාංකේය අපගේ ජාතියේ සෞභාග්‍යය සඳහා ලෙකෝ අඛණ්ඩව කැපවන බවට මම සහතික කොට ප්‍රකාශ කරමි.

අවසාන වශයෙන්, උපදෙස් හා මගපෙන්වීම් සිදු කරන ගරු අමාත්‍යතුමාටත්, නියෝජ්‍ය අමාත්‍යතුමාට සහ අමාත්‍යාංශයේ ලේකම්වරයාටත් මාගේ අවංක ස්තුතිය පුද කරමි. සියලු ශ්‍රේණියට අයත් ඇපකැපවූ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සාමූහික ප්‍රයත්නයන් හා දායකත්වය මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ අගනා මඟපෙන්වීම් නිසා ලෙකෝ අද සිටින තත්වයට ළඟා වී ඇති බව නැවත නැවතත් පැවසීම මැනැවැයි සිතමි.

ලබා දුන් සහයෝගය පිළිබඳව පාරිභෝගකියන්ට, කොටස්කරුවන්ට, ව්‍යාපාරික සහකරුවන්ට, බැංකුකරුවන්ට, සැපයුම්කරුවන්ට, සමාගම් ලේකම්වරුන්ට, විගණකවරුන්ට සහ පුද්ගලයන්ට අපගේ කෘතවේදීත්වය පළකිරීමට මම කැමැත්තෙමි.

**කේ.ආර්.එච්. ලාල් ගුණසේකර**
සභාපති



## සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය

2015 වසර යනු ලෙකෝ හට ලාභ අත්කර දුන් තවත් වසරක් විය. එය හුදු තවත් ව්‍යාපාරිකමය වසරක් පමණක්ම නොව, ආයතනය සුහුරු මනු තාක්ෂණය යුගයක් වෙත කැන්දා ගෙන ගිය යුගයකට මුල පිරූ වසරකි. බලශක්ති සංරක්ෂණය හරිත බලශක්තිය පද්ධතියට උකහා ගැනීම සහ පාරිභෝගික පහසුව අත් කර දුන් තාක්ෂණයක් ලෙස සුහුරු මනු තාක්ෂණය ලෝකය වැළඳ ගෙන ඇත.

සුහුරු මනු ක්‍රමය පිළිබඳව ප්‍රතිපත්තියක් වසර කිහිපයකට පෙර ශ්‍රී ලංකා රජය ප්‍රකාශයට පත් කර ඇත. මේ සම්බන්ධව නවතම මෘදුකාංගයක්, අපගේ පර්යේෂණ හා සංවර්ධන අංශය සකසා ඇත. මෙම නව තාක්ෂණයන් දියත් කිරීම සඳහා වන කෝට්ටේ හරිත කලාප නියාමන ව්‍යාපෘතිය තවත් එක් පියවරකි.

පසුගිය වසරට සාපේක්ෂව සියයට 6.46 ක් වු වාර්ෂික බලශක්ති හානිය සියයට 3.76 තෙක් තවදුරටත් අඩු කිරීමට සමාගමට හැකි විය. අපගේ බලශක්ති අලෙවිය හා සම්බන්ධිත මෙහෙයුම් ගාස්තු ක්‍රමයකට යටත්ව හා අයවැයට වෙන්ව ඇති ප්‍රතිපාදන තළ අපගේ වියදම් සිදු කිරීමට හැකි විය. මිලියන 669 ක් වටිනා සම්පත් සමාගම ජාලයට එක් කර ඇත.

සේවා ලබා දීමේදී හා සමාජමය කටයුතුවලදී අනුග්‍රහයන් ලබා දීමේදී ලෙකෝ කළමනාකාරිත්වය හා සේවකයන් වෙනත් ආයතන සහ ආගමික ආයතන සමග සහසම්බන්ධ වී කටයුතු කෙරේ. 2015 වසර තුළ රු. මිලියන 5.3 ක මුදලක් සමාජ වගකීම් වෙනුවෙන් වියදම් කර ඇත.

සුහුරු (SMART) තාක්ෂණයන් සදහා වන ආයෝජන ඇතුළුව වසර පහක් සඳහා වන ගාස්තු පැනවීම ඉදිරිපත් කර ඇති අතර, අපගේ පාරිභෝගිකයන් වඩාත් මහත්මාවරුන් බවට පත් කරන සුහුරු පද්ධතිය සඳහා වූ ගමනට අප පිවිස ඇත.

**එච්.එන්. ගුණසේකර**
සාමාන්‍යාධිකාරී





# ඉලක්කය 01

## භූ අවකාශ දත්ත සමුදාය

අපගේ වත්කම් සමුදාය සමඟ සබැඳුණු චන්ද්‍රිකා සැකසීමට අදාලව මූලික අවකාශ දත්ත සමුදායක් සැලසුම්කරණය. විවිධ භූගෝලීය ප්‍රදේශවල සිටින පාරිභෝගිකයන්ට අදාලව බිල් සැකසීම සහ සැලසුම්කරණ කටයුතු වලට අදාළ දත්ත සඳහා ප්‍රවේශ වීමට මෙය අපට උපකාරිවේ.

# ප්‍රගතිය / ක්‍රමවේදය/ අරමුණු

## අධ්‍යක්ෂ මණ්ඩලය

පී. අල්ගම මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඩබ්.ඩී.ඩීස්. විජයපාල මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ලාල් ගුණසේකර මහතා
සභාපති

ජායාරූපයේ නොදැක්වෙන
- එ.මි.සී. වික්‍රමසේකර මහතා
- ඩී.එස්. පී.කේ. කරුණාසේකර මහතා
- ජේ.එම්.වී.පී. ජයසුරිය මහතා

### ප්‍රගතියේ නව ඉසව්

අස්ථාවර ව්‍යාපාරික වටපිටාව හා බලශක්ති සම්පත් කළමනාකරණයේ ඇති විශ්වමය අභියෝග, කාර්යක්ෂමතාවය වැඩි කිරීමට සහ ඵලදායිත්වය, තිරසාරත්වය හා ලාභය වර්ධනය කිරීමේ මාර්ග සඳහා වඩා ඉඩ හසර ඇති කරන බව ලෙකෝ පිළිගනී. මෙම අවසන් අරමුණ කරා යාමේදී, තොරතුරු තාක්ෂණය භාවිත නව නිපැයුම්, තම මානව සම්පත උපරිම ලෙස කළමනාකරණය, තම මෙහෙයුම් ශක්‍යතා උපරිම ලෙස සිදු කිරීම හා කොටස්කරුවන්, නියාමකයන් සහ ව්‍යාපාරික සහකරුවන් සමඟ සබඳතා වර්ධනය කිරීමේ ලා ලෙකෝ ඇප කැපව කටයුතු කෙරේ.

### අපගේ ක්‍රමවේදය

පාරිභෝගිකයා ඉලක්ක කර ගත් උපයෝගිතා සමාගමක්, තම බලශක්ති සම්බන්ධිත සේවා හා නිෂ්පාදනවල නිරත සහ ගැඹුරු පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාදාම හමුවේ අභ්‍යන්තරික ක්‍රියාත්මක හැකියාවන් වැඩිදියුණු කරන අතර තුර, කොටස්කරුවන්ගේ වත්කම හා සේවක තෘප්තිය වර්ධනය කරමින් තරගකාරී බලශක්ති වෙළෙඳපලක් ඇති කරන ප්‍රධාන හා ඉදිරිගාමී සංවිධානයක් ලෙසට ලෙකෝ ප්‍රතිසැකසුම.




## විශ්වසනීයත්ව වර්ධනය

උඩු රැහැන් ජාලය භූගත රැහැන් පද්ධතියක් බවට පත් කිරීම. තවද, මධ්‍යම භාවිතාව සඳහා වේගවත් අන්තර් ක්‍රියාකාරිත්ව පෙන්නුම් කරන නවීන බෙදාහැරීම් පාලන මධ්‍යස්ථානය



# සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

**සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව**
2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ හා එහි උප ආයතනවල විගණිත මූල්‍ය ප්‍රකාශන සමඟ එහි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම පිළිබඳව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටු වේ.

සමාගමේ කටයුතු පිළිබද මෙම වාර්ෂික වාර්තාව තුළ 2007 අංක 7 දරන සමාගම් පනතේ 168 වන වගන්තියට අනුව අවශ්‍ය කරන තොරතුරු හා ඇතැම් අතිරේක විස්තර අන්තර්ගත ව ඇත.

**සමාගමේ හා උප ආයතනවල ප්‍රධාන ක්‍රියාකාරකම් හා වසරේ කාර්යසාධන විමසුම**

වසර තුළ නොවෙනස්ව පැවති, සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ විදුලි බලය සිල්ලරව අලෙවි කිරීමේ ව්‍යාපාරයයි. ලංකා විදුලිබල මණ්ඩලයට හිමි, එමගින් පාලනය කරනු ලබන ජාතික පද්ධතියෙන් සමාගම තොග වශයෙන් විදුලි බලය මිලදී ගෙන සමාගම විසින් පාලනය කරන නවීන බෙදාහැරීමේ පද්ධතියක් මගින් පාරිභෝගිකයන් වෙත බෙදා හැරේ.

උප සමාගම් හා ඒවායේ ප්‍රධාන කටයුතු පහත දක්වා ඇත.

සී/ස ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පෞද්ගලික) සමාගම

අද වන විට මෙහෙයුම් අඩු වී ඇති රට තුළ විදුලිය බෙදා හැරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

සී/ස ඇන්ටෙ ලෙකෝ මීටරින් (පෞද්ගලික) සමාගම

ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික් මනු අවශ්‍යතා පිරිමසා ගැනීම හා අපනයන වෙළෙඳපොල සඳහා බලශක්ති මීටර නිෂ්පාදන කම්හලක් පවත්වාගෙනයාම.

**මෙහෙයුම් ප්‍රතිඵල**

| | 2015 | | 2014 | |
|---|---|---|---|---|
| | සමූහ ව්‍යාපාරය රු.'000 | සමාගම රු.'000 | සමූහ ව්‍යාපාරය රු.'000 | සමාගම රු.'000 |
| ආදායම | 26,774,028 | 26,193,589 | 24,332,107 | 23,780,990 |
| දළ ලාභය | 3,367,009 | 3,309,308 | 3,808,905 | 3,730,862 |
| බදු පෙර ලාභය | 1,523,935 | 1,472,263 | 2,300,178 | 2,238,612 |
| වසරේ සමස්ත විස්තීරන ආදායම බදු හැර | 1,056,239 | 1,020,510 | 8,076,047 | 8,072,289 |

**මූල්‍ය ප්‍රකාශන**
සමාගමේ මූල්‍ය ප්‍රකාශන සියල්ල අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් කේ.ආර්.එච්. ලාල් ගුණසේකර මහතා සහ පී. අල්ගම මහතා විසින් නිසි ලෙස අත්සන් තබනු ලැබ ඇත.

**විගණක වාර්තාව**
සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකවරුන්ගේ වාර්තාව, මූල්‍ය ප්‍රකාශන සමඟ අමුණා ඇත.

**ගිණුම් ප්‍රතිපත්ති**
සමාගමේ හා සමූහ ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන SLFRS/LKAS වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සකසා ඇති අතර ඒවාට අදාළව උපයෝගි කළ ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල 2.7 සිට 2.8 දක්වා පිටු අංක 41 සිට 50 දක්වා අඩංගු කර ඇත.

**ප්‍රකාශිත ප්‍රාග්ධනය**
2015 දෙසැම්බර් 31 දිනට සමාගමේ සමස්ත ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.1,145,067,000 ක් වූ අතර එය "ඒ" පන්තියේ සාමාන්‍ය කොටස් 113,580,264 කින් හා "බී" පංතියේ සාමාන්‍ය කොටස් 926,390 සමන්විත විය.

සමාගමේ  කොටස් ප්‍රාග්ධනය ගලායාම ගිණුම්වල 10 වන සටහනේ දක්වා ඇත.

**අධ්‍යක්ෂවරුන්**

31.12.2015 දිනට නිල වශයෙන් කටයුතු කළ සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දක්වා ඇත.

- කේ.ආර්.එච්.එල්. ගුණසේකර මහතා (සභාපති)
- ඩබ්.ඩී.ඒ.එස්. විජයපාල මහතා
- එම්.සී. වික්‍රමසේකර මහතා
- පී. අල්ගම මහතා
- ඩී.එස්.පී.කේ. කරුණාසේකර මහතා

භාණ්ඩාගාරය නියෝජනය කළ පී.කේ.ඒ.ඩී. ද සිල්වා මහත්මිය 2015 ජනවාරි 20 වන දින ඉල්ලා අස්වූ අතර, පී. අල්ගම මහතා 2016 අප්‍රේල් 07 වන දින සිට පත් කෙරිණි.

ජේ.එම්.වී.පී. ජයසූරිය මහතා 13.01.2016 වන දින පත් කෙරිනි. 31.12.2015 දිනට උප සමාගම් වල අධ්‍යක්ෂවරුන්ගේ නම් පහත දක්වා ඇත.

**සී/ස ඇන්ටෙ ලෙකෝ මීටරින් (පෞද්.) සමාගම**

- එම්.සී. වික්‍රමසේකර මහතා
- ලියු ජියාන්වු මහතා
- ෂෙන් ඩිංජිං මහතා
- එච්.එන්. ගුණසේකර මහතා

2015 පෙබරවාරි 11 වන දින රාජකාරියෙන් ඉවත් වූ සාගර කාරියවසම් හා ඩබ්.ජේ.එල්.එස්. ප්‍රනාන්දු මහත්වරුන් වෙනුවට, සභාපති කේ.ඒ. බන්දුල චන්ද්‍රසේකර හා අධ්‍යක්ෂ එම්. සී. වික්‍රමසේකර යන මහත්වරුන් එදිනම පත් කෙරිණි. එච්.එන්. ගුණසේකර මහතා 2015 මැයි 18 වන දින පත් කෙරිනි.

2016 ජනවාරි 01 දින ඉවත්වූ කේ.ඒ.බී. චන්ද්‍රසේකර මහතා වෙනුවට අධ්‍යක්ෂ කේ.ආර්.එච්.එල්. ගුණසේකර මහතා එදින සිට ක්‍රියාත්මක වන ලෙස පත් කෙරිනි.

**සී/ස ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පෞද්.) සමාගම**

- කේ.ආර්.එච්.එල්. ගුණසේකර මහතා (සභාපති)
- ජේ.එම්.වී.පී. ජයසූරිය මහතා
- එච්.එන්. ගුණසේකර මහතා
- එස්.එල්. ජයසේකර මහතා

**පොලී ලේඛන**

සමාගම හා උප සමාගම් 2007 අංක 7 දරන සමාගම් පනතේ දක්වා ඇති පරිදි පොලී ලේඛන පවත්වාගෙන යයි.

සමාලෝචිත ගිණුම් කාලසීමාව තුළ සමාගමේ කොන්ත්‍රාත්වල හෝ අදාළ පාර්ශ්ව සමග සෘජුව හෝ වක්‍ර ගනුදෙනුවල නිරත අධ්‍යක්ෂවරුන් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල 27 වන සටහනේ දක්වා ඇත.

**අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික**

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශනවල 27.3 සටහනේද, අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු 21 සටහනේ "සමූහ ව්‍යාපාර" තීරුවේ උප සමාගම් වල අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික ද ඇතුළත්ව සඳහන් කර ඇත.

**පරිත්‍යාග**

සමාගම විසින් වසර තුළදී කළ පරිත්‍යාග හා දායකවීම් වල අගය රු. 65,000/- කි.

**දේපල, පිරියත හා උපකරණ**

දේපල, පිරියත හා උපකරණ වල ගලායාමට අදාළ තොරතුරු විගණිත ගිණුම්වල 3 වන සටහනෙහි අඩංගු කර ඇත.

**සංචිත**

2015 දෙසැම්බර් 31 දිනට සමාගම් සංචිත මුළු ප්‍රමාණය රු. බිලියන 22.6 ක් විය. ගලායාම මූල්‍ය ප්‍රකාශන වල 11 සටහනේ දක්වා ඇත. අදාළ කාලය තුල සමූහ ව්‍යාපාරය රඳවා ගැනීමට හැකි වූ මුදල රු. බිලියන 22.78 කි.

**සේවා නියුක්තිය**

2015 අවසානය වන විට සමාගමේ සේවා නියුක්තිකයන් සංඛ්‍යාව 1465 ක් විය.

**වගකීම් හා හදිසි අවිනිශ්චිතතා**

2015 දෙසැම්බර් 31 වන දිනට වගකීම් හා හදිසි අවිනිශ්චිතතා මූල්‍ය ප්‍රකාශන වල 25 සටහනේ දක්වා ඇත.

**විගණකවරුන්**

වරලත් ගණකාධිකාරීවරුන් වන අර්නස්ට් ඇන්ඩ් යං සමාගමේ විගණකවරුන් ලෙස කටයුතු කළ අතර වරලත් ගණකාධිකාරීවරු වන අමරසේකර සහ සමාගම සමාගමට බදු අනුකූලතා සේවා ලබා දුනි. එමෙන්ම සීමා. ඇන්ටි මීටරිං (පුද්.) සමාග මේ සමාලෝචිත වසරේ විගණකරුන් ලෙස කටයුතු කෙරිනි. සීමා. ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පුද්) සමාගමේ විගණකවරුන් ලෙස අර්නස්ට් ඇන්ඩ් යං කටයුතු කරයි. සමාගම හෝ එහි සමූහ ව්‍යාපාරයේ සමාගම් පිළිබඳව විගණක ලෙස හැර වෙනත් කිසිදු සම්බන්ධයක් නොමැති අතර එමෙන්ම උක්ත තනතුර දරමින් බදු අනුකූලතාව පිළිබඳ උපදේශකවරු ලෙස කටයුතු කෙරේ.





| සමාගම | විගණකවරයාගේ නම | ගෙවුම් මාදිලිය | මුදල (රු.) |
|---|---|---|---|
| සී/ස ලංකා විදුලි (පෞද්.) සමාගම | අර්නස්ට් සහ යං වරලත් ගණකාධිකාරීවරු | විගණක ගාස්තු - ප්‍රතිපූර්ණය කළ හැකි වියදම් (බදු සහිත) | 2,831,950/- |
| | අමරසේකර සහ සමාගම වරලත් ගණකාධිකාරීවරු | විගණක නොවන ගාස්තු | 822,852/- |
| සී/ස ඇන්ටෙ ලෙකෝ මීටරින් (පෞද්.) සමාගම | අමරසේකර සහ සමාගම වරලත් ගණකාධිකාරීවරු | විගණක ගාස්තු - ප්‍රතිපූර්ණය කළ හැකි වියදම් (බදු රහිත) | 290,000/- |
| | | විගණක නොවන ගාස්තු | 183,672/- |
| සී/ස ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පෞද්.) සමාගම | අර්නස්ට් සහ යං වරලත් ගණකාධිකාරීවරු | විගණක ගාස්තු - ප්‍රතිපූර්ණය කළ හැකි වියදම් (බදු රහිත) | 113,585/50 |

විගණකවරුන් තවදුරටත් තම රාජකාරි කටයුතු වල නිරත වීමට කැමැත්ත පළ කර තිබුණි. විගණකවරුන් නැවත පත් කිරීම හා තම පාරිශ්‍රමිකය තීරණය කිරීමට අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීම මහා සභා රැස්වීමේ දී යෝජනා කෙරෙනු ඇත.

**ශේෂපත්‍ර දිනට පසුව ඇති වූ සිදුවීම්**

මෙම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමක් කළ යුතු හෝ හෙළිදරව් කිරීමක් කිරීමට අවශ්‍ය වන, දන්වා සිටින කාල සීමාවට පසුව කිසිදු ද්‍රව්‍යාත්මක සිදුවීමක් සිදු වී නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරමින් හා ඒ වෙනුවෙන් සභාපතිතුමා හා අධ්‍යක්ෂවරයෙකු මෙම වාර්ෂික වාර්තාවට අත්සන් කර ඇත.

සභාපති

අධ්‍යක්ෂ

ලේකම්වරු
**සී/ස පී ඩබ් කෝපරේට් සෙක්‍රටරියල් (පෞද්) සමාගම**

2016 ජුනි 24 වන දින

# ආයතනික කළමනාකාරිත්වය



සුල්ෆිකා ඒ. බාෂිත්
ප්‍රධාන මූල්‍ය නිලධාරි

ආචාර්ය. පී.එස්.එන්. ද සිල්වා
ප්‍රධානි - ඉංජිනේරු අංශය

එස්.එල්. ජයසේකර මයා
ප්‍රධානී - මෙහෙයුම්

එච්.එන්. ගුණසේකර මයා
සාමාන්‍යාධිකාරි

ලාල් ගුණසේකර මහතා
සභාපති



## ඉංජිනේරු අංශය

"සුහුරු ජාල" (SMART GRID) නමැති ආයතනික ඉලක්කය හඹා යාමේදී 2015 වසර තුළ වඩාත් සාර්ථකත්වයන් ලබා ගැනීමට ඉංජිනේරු අංශයට හැකි විය.

2016 වසරින් ආරම්භ කර වසර පහක දෙවන නියාමන කාල වකවානුවට පිවිසීමේ ප්‍රධාන පූර්ව අවශ්‍යතාව ක් ලෙස, 2015 වසර ආරම්භයේදී ඉලක්ක හතරක් ඉංජිනේරු අංශය විසින් හඳුනා ගෙන ඇත. මෙහිදී තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සියල්ල විමර්ශනය කර, ඒ වෙනුවට නව ඒවා යෙදීමට සිදු විය. ආපදා සුරැකුම් විමර්ශනය, ව්‍යාපාර සම්පත් කළමනාකරණය (ERP), මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) හා ආදායම් රැස්කිරීමේ පද්ධතිය (RCS) සමඟ තොරතුරු තාක්ෂණ ආරක්ෂාව ප්‍රතිසංවිධානය කිරීමට සිදු විය. පද්ධති අධි ශ්‍රේණිගත කර වැඩිදියුණු කිරීමට මෙන්ම කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට සිදු විය. මෙම අංශයේ පර්යේෂණ හා වැඩිදියුණු කිරීම් සදහා වැඩිදියුණුකළ ක්‍රමවේද ඇති කරමින් දේශීය ස්මාට් ජාලක ක්‍රම හා තාක්ෂණයන් ලබා ගැනීමට සිදු විය.

ඉංජිනේරු අංශය ලෙස මෙකී ඉලක්ක කරා යාමේ අපගේ සාර්ථකත්වය ලබා ගැනීම පිළිබඳව අපි ආඩම්බර වන්නෙමු.

සමාගමේ පරිගණක හා ඒ සම්බන්ධ දෘඩාංග ආසන්න වශයෙන් 90%ක් ඉවත් කර, ඒ වෙනුවට නව උපකරණ යොදා ගෙන ඇති අතර, එමගින් සුහුරු ජාල ආයතනික ඉලක්කය දිනා ගැනීම සඳහා අවශ්‍ය, නවීන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සකසා ගැනීමට සමත් වී ඇත. ජාලය වඩාත් සවිබල ගන්වා නව දෘඩාංගවලට උචිත වන ලෙස IPVPN පුළුල් කර ඇත. ආපදා නිවාරන පරිශ්‍රය (DRs) නුගේගොඩ ශාඛා කාර්යාලයේ පිහිටුවා එහි සියලු මෙහෙයුම් කටයුතු අරඹන ලදී. PRONTO ERP මිලදී ගෙන සවි කර ඇත. මානව සම්පත් තොරතුරු පද්ධතිය වැඩිදියුණු කෙරිණි. අපේම සොයා ගැනීමක් ලෙස ලංකා විදුලි සමාගමට ආඩම්බර විය හැකි, ආදායම් රැස් කිරීමේ පද්ධතිය (RCS) ආරම්භ කර පූර්ණ ක්‍රියාකාරිත්වයට පත් කර ඇත. RCS ලබා ගැනීමත් සමඟ ආදායම් නිලධාරින්ට හස්ථගත පද්ධතියක් ලබා දීමෙන්, අපගේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව තවත් දැවැන්ත දියුණුවකට පිවිසී ඇත. ඇන්ඩ්‍රොයිඩ් ප්ලැට්ෆෝම් (Android platform) පිළිබඳ මෘදුකාංගය අපේම මෘදුකාංග තනන්නන් විසින් වැඩිදියුණු කර ඇති අතර ගැලපෙන හෑන්ඩ්හෙල්ඩ් (handhelds) මිල දී ගෙන ඇත.

සුහුරු ජාල වැඩිදියුණුකිරීම් සලකා බලන විට, 2015 වසර ඉතාමත් ඵලදායි වසරක් බවට පත් වී ඇත. ලෙකෝ විසින් තම සුහුරු මනු කළමනාකරණ පද්ධතිය (SMMS) සකසා ගෙන ඇත. සුහුරු ජාල තාක්ෂණ සඳහා වූ අත්හදාබැලීම් සදහා වෙන් කර ඇති හරිත කලාපය මගින් ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදානයක් යටතේ ඊයම් වීදි පහන් ක්‍රමයක් සමග නවීන වීදි පහන් පාලන පද්ධතියක් සැකසීමට සමත් වි ඇත. හරිත කලාපයේ පෙර ගෙවුම් පද්ධති හා ජාලක අධීක්ෂණය සිදු කිරීම සදහා GPRS මූලික වැඩිදියුණු කළ මොඩමක් සකසා ගැනීමට එක්සත් ජනපදයේ ජීඑස්එම් ඇසෝසියේෂන් සමාගමෙන් ප්‍රදානයක් ලබා ගැනීමට ලෙකෝ මෙන්ම ඩයලොග් ඇක්සියාටා සමාගමට හැකි විය. මෙම ප්‍රදානය යටතේ කලාපයේ ඇති මුළු මනු වලින් 50% ක්ම ඉවත් කර, ඒ වෙනුවට නවීන සුහුරු මනු යෙදීමට ප්‍රතිපාදන සලසා ඇත. නිවැස් ප්‍රදේශ ජාලක සදහා ජාලක පුරුකක් ලෙස දත්ත සැකසීම හැකි දියුණුකළ මොඩමයක් මගින් IoT මූලික ප්ලැට්ෆෝමයකට සන්නිවේදනය වන ලෙස මෙම සුහුරු මනු සැළසුම් කර ඇත. එය මොරටුව විශ්ව විද්‍යාලය හා ඒකාබද්ධව වැඩිදියුණු කළ අතර අපගේම උප ආයතනයක් වන ඇන්ටෙ ලෙකෝ මීටරින් සමාගම විසින් නිපදවන ලදී. දේශීය තත්වයන්ට ගැලපෙන අපගේ සුහුරු මොඩමය මගින් ක්‍රියාකළ හැකි ස්වයංක්‍රීය ඉල්ලුම් ප්‍රතික්‍රියා පද්ධතියක් සැකසීම සඳහා තුන් අවුරුදු ව්‍යාපෘතියක් ඉංජිනේරු අංශය විසින් දියත් කර ඇත. 2015 වසරේ අවසාන කාල වකවානුව වන විට උපයෝගිතා පාලන ක්‍රමයක් මගින් ආලෝකය හා වායු සමීකරණ විබර දුරස්ථව පාලනය කරන මෙම ADR පද්ධතියේ ප්‍රථම වර්ගය සකසා ගැනීමට ලෙකෝට හැකි විය. දැනට පවතින කණු මත සවිකළ දෝෂ සෙවීමේ පද්ධතිය අධ්‍යයනය කිරීම සඳහා නියාමන ව්‍යාපෘතියක් සවි කිරීම අවසන් කර ඇත.

උක්ත සඳහන් ADR ව්‍යාපෘතිය හා PMU පාදක ජාල නියාමන උපක්‍රමය හැඳින්වීමේ අනෙක් ව්‍යාපෘතිය 2015 වසරේ ආරම්භ කර 2016 වසර දක්වා සිදු කිරීමට නියමිතය. පෙර ගෙවුම් මිටරය, ස්වයංක්‍රීය බෙදාහැරීම් මධ්‍යස්ථානය හා වැඩිදියුණු කළ ඒඩීආර් (ADR) ක්‍රමවේද 2015 වසරේ අපේම සාර්ථක හා ඵලදායි වැඩිදියුණු කිරීම්වල ඵලයක් ලෙස 2016 වසරේ දී හඳුන්වා දීමට නියමිතය.

# මානව සම්පත් හා පරිපාලන

අපගේ මානව සම්පත් ක්‍රමවේදයේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ, අනගි තම ප්‍රතිඵල අත් කර දීමට කාර්ය මණ්ඩලය උනන්දු කරලීමට කැපවීමයි. මෙහිදී, අපගේ විවිධත්වයෙන් හෙබි මානව සම්පත යොදාගැනීමේදි සමානාත්මතාවය, විනිවිදභාවය, සාධාරණත්වය හා සේවා ඇගයීම සිදු කිරීමට අපි වගබලා ගන්නෙමු.

වටිනාකම් උත්පාදනය කිරීමෙහිලා කාර්ය මණ්ඩලයේ කාර්යභාරය ඉතා වැදගත් වන බව ලෙකෝ අපි විශ්වාස කරන්නෙමු. එබැවින් සේවක දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම පිණිස අප විශේෂිතව පුහුණු වැඩසටහන් සකසා ඇත. ප්‍රසන්න, නිදහස් සේවා වාතාවරණය හා ඒකාබද්ධ තොරතුරු තාක්ෂණ පද්ධති මගින් නිවැරදි හා කඩිනම් සේවා නිපැයුමක් අඛණ්ඩව සලසා දෙයි. අප කාර්ය මණ්ඩලය අතර වගකීම්සහගතබව හා කැපවීම පොදු වටිනාකමක් ලෙස අවබෝධ කර දී ඇත.

2015 වසරේ වාර්තා වූ ප්‍රශංසනීය 0.008 ක අනුපාතයෙන් යුතු අඩු සේවක ඉවත්වීමේ අනුපාතය මගින් සේවක තෘප්තිය ඉතා පැහැදිලිව පෙන්නුම් කෙරේ.

**වෘත්තීමය දියුණුව**

වෘත්තීමය ආයතනවල වාර්ෂික දායක මුදල ප්‍රතිපූර්ණය කිරීමට කළමනාකරණ තලයේ සිටින නිලධාරීන්ට හිමිකම ඇත. තම රැකියා ක්ෂේත්‍රයට අදාළව උසස් අධ්‍යාපනය කරගෙනයාම සඳහා අවශ්‍ය මූල්‍යමය සහාය සඳහා සියලු සේවකයන්ට අවස්ථාව ලබා දි ඇත. මෙමගින් තම උපරිම සේවාව ලෙකෝ වෙත පුද කරමින්ම තම වෘත්තිය වැඩිදියුණුව සළසා ගැනීමට සේවකයන්ට හැකි වී ඇත.

තම සැඟවුණු කුසලතා වර්ධනය කර ගැනීමට හා ඉස්මතු කර ගැනීමට උර දෙන දැනුම බෙදා දෙන, රැකියා අභිමුඛ, රැකියාවේ දියුණුව  සලසන අභ්‍යන්තරික වැඩසටහන් අප පවත්වා ඇති අතර ඒවා මගින් වෘත්තීමය වැඩිදියුණුව සඳහා නව මං පෙත් සලසා දීමට හැකි වී ඇත.

**පිළිගැනුම**

ලෙකෝ හි වසර 25 කට වැඩි සාර්ථක සේවා කාලයක් සපුරන සේවකයන් වාර්ෂිකව ඇගයීමට ලක් කර සම්මාන පිදීම සිදු කෙරේ.

මෙය වාර්ෂික දිර්ඝ සේවා ප්‍රණාම උළෙලේ දී සිදු කෙරේ. අධ්‍යාපන කටයුතුවල සාර්ථකත්වයන් ලබා ගත් සේවක දරුවන් ද හඳුනා ගෙන ඔවුන්ට මෙම උත්සව අවස්ථාවේදී ම ත්‍යාග ලබා දීම සිදු කෙරේ.

ලෙකෝ වෙත කරන සේවය සලකා සේවක දරුවන් හට ද අභ්‍යන්තර පුරප්පාඩුවලට අයදුම් කිරීමට අවස්ථා ලැබෙන අතර තෝරාගැනීම විනිවිදභාවයකින් සිදු කෙරේ.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, අවශ්‍යතාව අනුව ශාඛා කාර්යාල හා වැඩබිම් වෙත ගොස් සේවකයන්ගේ ගැටලු විසඳමින් හා මනා සබඳතා පවත්වා ගනිමින් ඔවුන් සමඟ අඛණ්ඩව සම්බන්ධීකරණයක් පවත්වාගෙන යයි.

**සබඳතාවය**

සභාපතිතුමා, සාමාන්‍යාධිකාරී හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ රැස්වීම් පවත්වා ව්‍යාපාරික කටයුතු හා කාර්යසාධනය පිළිබඳව ඔවුන් දැනුවත් කෙරේ. සේවක අභිප්‍රායන් හා තෘප්තිමත්වීමේ මට්ටම හඳුනා ගැනීමට මෙම රැස්වීම් මගින් අවස්ථාව සැලසේ. සේවකයන් මුහුණ දෙන දුක්ගැනවිලි නිරාකරණය කිරීම සඳහා වෘත්තිය සමිති නිරන්තරව මානව සම්පත් අංශය හා සම්බන්ධ වේ. විවෘත ප්‍රතිපත්තියක් අනුගමනය කරන අප සමාගමෙහි සේවකයන්ට, සමූහ ව්‍යාපාර සභාපති ඇතුළුව ඕනෑම ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු හමුවීමට හැකියාව ඇත. එමගින් දුක්ගැනවිලි දැනුම් දීමටත්, යෝජනා ඉදිරිපත් කිරීමට හෝ සබඳතා තර කර ගැනීමටත් හැකිවේ. සමූහ හමුවීම් මගින් ද්විත්ව මාර්ගික සන්නිවේදනය තහවුරු කෙරේ.

**සේවා දිවි සමබරතාවය**

සේවකයන් වෙනුවෙන් සහනදායි මිලගණන්වලින් යුත් නිවාඩු නිකේතනයක් අපි පවත්වාගෙන යන්නෙමු. නිවාඩු කාලය ගත කිරීම සඳහා අඩ මාසික වැටුපට සමාන නිවාඩු දීමනාවක් සේවකයන්ට ගෙවනු ලැබේ.

'වාර්ෂික' ක්‍රීඩා උළෙල යනු සියලු ශ්‍රේණීන්ට අයත් සේවක පවුල් එකට එක් වන ප්‍රධාන සමාජමය කටයුත්තකි.

සේවකයින් වෙත ලබා දෙන අතුරු ප්‍රතිලාභ  ප්‍රමාණය අප ක්ෂේත්‍රයේ සිටින අන් අය  පරයා යන තරම් වේ. වෛද්‍ය රක්ෂණය, අවමගුල් අවස්ථාවල මූල්‍ය සහාය, සහන පොලී යටතේ වන ආපදා, වාහන හා නිවාස ණය, උසස් අධ්‍යාපනික මූල්‍ය සහාය වැනි දෑ සඳහා හිමිකම් ලබයි.



# අභ්‍යන්තර විගණන කණ්ඩායම

## යහපාලනය

### විගණන සහ කළමනාකරණ කමිටුව

සමාගමේ මෙහෙයුම් පිළිබඳව ස්වාධීන අදහසක් ලබා ගැනීමේ අදහසින් භාණ්ඩාගාර නියෝජිතයෙකු ප්‍රධානත්වය උසුලන අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර 2015 වසර තුළ සාර්ථක රැස්වීම් වාර හතරක් පැවැත්විණි. එහිදී සී/ස ලංකා විදුලි (පෞද්.) සමාගම තම කටයුතු වලදී අවංකත්වය, විනිවිදභාවය හා යහ පාලනය ප්‍රවර්ධනය කිරීම සොයා බැලීම සිදු විය.

ලබා දුන් එම්අයිඑස් (MIS) වාර්තා අර්ථවත් ලෙස විමර්ශනයට ලක් කිරීම, අභ්‍යන්තර විගණක නිරීක්ෂණ පිළිබඳ සාධනීය පියවර ගැනීම හා දැඩි ලෙස පරීක්ෂා කළ යුතුව ඇති විශේෂිත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා පිළිබඳව පරීක්ෂා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අවස්ථාව ඇති වීමද සමාලෝචිත කාලසීමාව තුළ කමිටුව විසින් කරන ලද ප්‍රධාන කර්තව්‍යයන් අතර වේ.

## කළමනාකරණ විමසුම

### අභ්‍යන්තර විගණන අංශය

වෘත්තීමය සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයකින් සමන්විත ලෙකෝ හි අභ්‍යන්තර විගණන කණ්ඩායම කළමනාකාරිත්වය විසින් සිදු කරන සියලු මෙහෙයුම් කටයුතු පිළිබඳව ස්වාධීන මතයක් ලබා දීම සඳහා නිසි වෘත්තීමය අවධානය සහිතව තම රාජකාරී සිදු කරයි.

සමාලෝචිත කාල සීමාව තුළදී, වසර ආරම්භයේ විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමතකළ මූලික සැලැස්මට අනුව කළමනාකාරිත්වය විසින් සැලසුම් කළ සියලු මෙහෙයුම් ක්ෂේත්‍ර හා අංශවලට අදාළව විගණන ඔවුන් විසින් පවත්වා තිබුණි.

සියලුම ශාඛා විගණන වාර්තා සභාපතිවරයා සමඟ ගැඹුරින් සාකච්ඡා කර ඒවා විගණන හා කළමනාකරණ කමිටුවේ අවධානයට යොමු කිරීමට පෙර ඉහළ කළමනාකාරිත්වයේ සිටින අදාළ නිලධාරීන් හට අවශ්‍ය කටයුතු සඳහා උපදෙස් ලබා දුණි.



# ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය





එස්.ඩී.සී. ගුණවර්ධන මයා
පද්ධති සංවර්ධන කළමනාකරු

එන්. ඒකනායක මයා
ප්‍රධාන අභ්‍යන්තර විගනක

කේ.ජී. කුලරත්න මයා
ව්‍යාපෘති කළමනාකරු

එච්.එච්. සුමනදාස මයා
පද්ධති මෙහෙයුම් කළමනාකරු

මධුර ගමගේ මයා
නියාමන කළමනාකරු

චන්දිම ප්‍රේමචන්ද්‍ර
පිරිස් කළමනාකරු

ජී.පී. සෙනෙවිරත්න මයා
පාරිභෝගික සේවා කළමනාකරු

# මෙහෙයුම් අංශය

මෙහෙයුම් අංශයේ ප්‍රධාන කාර්යභාරයන් වන්නේ අප වත්කම් කාර්යක්ෂම හා සක්‍රීය ලෙස භාවිත කර සැපයුම් විශ්වාසනීයත්වය පවත්වාගෙන යන අතරම විදුලිය සඳහා පාරිභෝගික ඉල්ලුම සැපිරීම වැනි ලෙකෝ ආයතනික පරමාර්ථ වලට අනුකූලව සේවා සැපයීමයි.

2014 වසරට සාපේක්ෂව තම පාරිභෝගික පදනම 1.5% ක් එනම් 2015 මෙම වසර අවසානය වන විට 521,982 තෙක් වර්ධනය කර ගැනීමට ලෙකෝට හැකි විය. පාරිභෝගියන් හට ගිවො පැය 1,218 ක් 2015 වසර තුල සමාගම ලබා දී ඇත. මෙම ගාස්තු කාණ්ඩ ලස වාර්ෂික පාරිභෝජනය පහත වගුවේ දක්වා ඇත.

| ගාස්තු වර්ගය | මුළු ගිණුම් ප්‍රමාණය | | වාර්ෂික පාරිභෝජනය | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුළු ප්‍රමාණයේ ප්‍රතිශතය | කිවොපැ | මුළු ප්‍රමාණයේ ප්‍රතිශතය |
| නිවෙස් | 439,365 | 84.17% | 556,661,102 | 46% |
| පොදු කාර්යය | 73,946 | 14.17% | 445,198,465 | 37% |
| වීදි පහන් | 2,828 | 0.54% | 25,632,726 | 2% |
| කර්මාන්ත හා හෝටල් | 3,364 | 0.64% | 318,813,160 | 26% |
| ආගමික හා පුණ්‍යායතන | 2,479 | 0.47% | 9,430,211 | 1% |
| **එකතුව** | **521,982** | **100%** | **1,218,781,192** | **100%** |




### හානිය අවම කිරීම

විදුලි බෙදාහැරීම් හානි ප්‍රමාණයන් අඛණ්ඩව නිරීක්ෂණයට ලක් කෙරෙන අතර, 2014 දෙසැම්බර් වන විට 4.02% ක් වූ මාස 12 ක හානි සාමාන්‍ය ප්‍රමාණය, මෙම වසර අග වන විට 3.76% තවදුරටත් අඩු කෙරිනි. සමාගම විසින් කැපීපෙනෙන අපතේ යාම් අවම කිරීමක් 2015 දී පවත්වාගෙන යාමට කටයුතු කර ඇති බව මෙමගින් සනාථ වේ.

### පද්ධති සංවර්ධනය

ඉහළ විශ්වසනීයත්වයකින් යුතු විදුලි සැපයුමක් ලබා දීමට හා වැඩිවන ඉල්ලුම සැපිරීම සදහා බෙදාහැරීම් ජාලය වැඩිදියුණුව පිණිස රු. මිලියන 673.30 ක් සමාගම ආයෝජනය කර ඇත. 2015 වසර අවසානය වන විට, බෙදාහැරීම් පද්ධති වත්කම් ප්‍රමාණය HV රැහැන් කි.මී. 1,064, LV රැහැන් කි.මී. 4,870 සමග බෙදාහැරීම් උපපොලවල් 2,331 කින් හා තොග උපපොලවල් 1,676 න් සමන්විත ව ඇත.

### සැපයුම් විශ්වසනීයත්වය

පාරිභෝගිකයන්ගේ සැපයුම් විශ්වාසය යනු ලෙකෝහි ප්‍රමුඛ පරමාර්ථයයි. 2014 වසරේ 15.85 ක් වූ පාරිභෝගික පැය ප්‍රමාණය අවම සැලසුම්සහගත විදුලි ඇනහිටීම් 2015 දී 13.34 ඇති කරමින් නඩත්තු කිරීම් සිදු කෙරිණි. මෙහිදී දිනකට පැය 8 සිට පැය 6 දක්වා කප්පාදුව අඩු කාල සීමාවක් ඇති කිරීමත්, සේවක කණ්ඩායම් වැඩි කිරීමත් සිදු විය. 2014 වර්ෂයේ 59.03 ක් වූ විදුලිය ඇනහිටුවන මුළු පැය/ පාරිභෝගික (SAIDI) සංඛ්‍යාව 2015 වසරේ දී 59.03 සිට 50.52 දක්වා අඩු විය.




### පාරිභෝගික සේවා

පාරිභෝගික ඉල්ලීම අනුව අදාළ ගෙවීම්වලින් පසුව නව සබඳතා සේවා ඇස්තමේන්තු මාස තුනක් තුළ නිකුත් කිරීම 75% සාර්ථකත්වයක් ඇතිව 2015 දෙසැම්බර් මස සිට ලෙකෝ අරඹා ඇත. සැපයුම් සේවා කේතය හා ලෙකෝ සේවා වගකීම් සහතිකය (රාජකාරී දින 10 ක් ඇතුළත) අනුකූලව එම ජයග්‍රාහී තත්වය සියයට 90 කින් පවත්වාගෙන යාමට සමත් විය. නිවැරදි බිල්පත් සඳහා ආදායම් රැස්කිරීම පිණිස අයවිය යුතු හිඟ බිල්පත් (දින 30 ± දින 3) සියයට 98 කට වැඩි ප්‍රමාණයක් අය කර ගනිමින් 2015 වර්ෂය තුළ පාරිභෝගික බිල්පත් සැකසුම සමාගම විසින් අඛණ්ඩව සිදු කෙරිණි.




එමෙන්ම, පාරිභෝගික හිතසුව පිණිස හා ලෙකෝ හි ඒකීයත්වය පවත්වාගෙන යාම සඳහා PUCSL අනුමත කර ඇති බලශක්ති තක්සේරුව සඳහා ක්‍රමවේදය 2015 දි ක්‍රියාවට නැංවිණි.

දකුණු මොරටුවේ පිහිටි පාරිභෝගික සේවා මධ්‍යස්ථානය වැඩි පහසුව හා පාරිභෝගික මෙන්ම ලෙකෝ කාර්ය මණ්ඩලයේ හිතසුව පිණිස අප සතු ගොඩනැගිල්ලක ප්‍රතිස්ථාපනය කෙරිණි.

## මූල්‍ය විමසුම

ලෙකෝ සමූහ ව්‍යාපාරයට අයත් සී/ස ලංකා විදුලි (පෞද්.) සමාගම, ඇන්ටෙ ලෙකෝ මීටරින් (පෞද්.) සමාගම හා සීමා. ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පෞද්.) සමාගම් වල සමස්ත මූල්‍ය කාර්යසාධනය

**ආදායම**

සමූහ ව්‍යාපාරයේ ආදායමින් සැලකියයුතු කොටසක් නියාමනය කර සෑම පස් වසරකින් විමර්ශනයට ලක් කෙරේ. සී/ස ලංකා විදුලි (පෞද්.) සමාගම නියාමන තත්වයක් යටතේ කටයුතු කරමින් රු. බිලියන 1.3 ක සමස්ත ලාභයක් උපයා ගෙන ඇත.

10% (y-o-y) ක් වාර්තා කරමින් 2015 වසරේ දී රු. මිලි. 27 ක වාර්තාගත ඒකබද්ධ ආදායමෙහි ඉහළ වර්ධනයක් ලබා ගැනීමට සමූහ ව්‍යාපාරයට හැකිවිය. 2015 වසර තුළ රු. මිලියන 492 ක මෙහෙයුම් ලාභයක් උපයා ගැනීමට සමාගමට හැකි විය. මීට අමතරව, භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂම කටයුතු කිරීම නිසා රු. මිලියන 524 ක පොලී ආදායමක් උපයා ගැනීමට සමාගම සමත්විය. ලැබීම් සියල්ලම මධ්‍යගතව මෙහෙය වූ අතර දූරදර්ශී ආයෝජන ක්‍රමවේදය මගින් එවැනි ප්‍රතිලාභයක් ලබා ගැනීමට සමාගමට මග පෑදිණි. සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පෞද්.) සමාගම රු. මිලි. 495 ක ශුද්ධ ලාභාංශයක් ලැබුණි.

**වියදම**

සමාගමේ මෙහෙයුම් වියදම 5.3% ක වර්ධනයක් (y-o-y) පෙන්නුම් කරමින් රු. බිලියන 3.5 කින් ඉහළ ගොස් ඇත. අනුමත අයවැය ප්‍රතිපාදන තුළ කටයුතු කිරීමට සක්‍රීය පිරිවැය පාලන ක්‍රමවේද සමාගම අනුගමනය කිරීම මගින් හැකියාව ලැබුණි.

වැඩිදියුණු කළ ආයතනික සම්පත් කළමනාකරණ මෘදුකාංගය, බිල්පත් සැකසීම හා මානව සම්පත් කළමනාකරණ මෘදුකාංගය, අපගේ අභ්‍යන්තර ක්‍රියාදාම හා බෙදාහැරීම් පද්ධති සඳහා වැඩි ප්‍රාග්ධන වියදමක් දැරීම තුළින් තම පාරිභෝගිකයන්ට තෘප්තිමත් සේවාවක් ලබා දීමට සමාගමට හැකිවිය.

නව බෙදුම් රැහැන් සවි කරීමත්, පූර්ණ ලෙස ක්ෂය වී ඇති වාහන විකණා දැමීමත් සිදුකෙරිණි.

## මූල්‍යමය ජයග්‍රහණ

| වසර | 2015 | 2014 | 2013 | 2012 | 2011 |
|---|---|---|---|---|---|
| ලාභදායිත්වය | | | | | |
| අලෙවි (රු. මිලි.) | 26,774,028 | 24,332,107 | 22,373,120 | 19,761,169 | 19,079,630 |
| දළ ලාභය (%) | 12.58% | 16% | 13% | 20% | 19% |
| ශුද්ධ (%) | 4.7% | 6.6% | 1.32% | 10.14% | 12.80% |
| කාරක ප්‍රාග්ධන කළමනාකරණය | | | | | |
| තථ්‍ය අනුපාතය (වාර) - වසරාවසාන) | 3.47 | 3.05 | 1.78 | 1.83 | 2.10 |
| ක්ෂණික වත්කම් අනුපාතය (වාර) වසරාවසාන) | 3.17 | 2.75 | 1.63 | 1.54 | 1.87 |
| ස්ථාවර වත්කම් පිරිවැටුම (වාර ) | 2.48 | 2.23 | 2.16 | 1.88 | 2.20 |








## පුනර්ජනනීය සම්පත් යොදාගැනීම

පුනර්ජනනීය බලශක්ති මගින් අපගේ ජාලය වර්ධනය කරවන ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණය (DSM) සහ ස්වයංක්‍රීය ඉල්ලුම් ප්‍රතික්‍රියා (ADR) සමඟ නවීන සේවාදායක පදනම මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමේ දේවල්වල අන්තර්ජාලයක් (IoT) මගින් ක්‍රියා කළ හැකි ස්මාට් මීටර් සවි කිරීම

# ස්වාධීන විගණක වාර්තාව

Ernst & Young
Chartered Accountants
201 De Saram Place
P.O. Box 101
Colombo 10
Sri Lanka

Tel : +94 11 2463500
Fax Gen : +94 11 2697369
Tax : +94 115578180
eysl@lk.ey.com
ey.com

EY
Building a better working world

NDeS/FNN/DM

**ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව**
**සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමේ කොටස්කරුවන් වෙත**

## මූල්‍ය ප්‍රකාශන වාර්තාව

සී/ස ලංකා විදුලි (පෞද්.) සමාගමේ ("සමාගම"), අමුණා ඇති මූල්‍ය ප්‍රකාශන අප විගණනය කළ අතර, 2015 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය තත්වය ප්‍රකාශනය ඇතුළත් වන සමාගමේ උප ආයතන ("සමූහ ව්‍යාපාරය") හා සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන හා ලාභාලාභ ප්‍රකාශනය සහ වෙනත් විස්තීරණ ආදායම්, සමකොටස් වෙනස්වීමේ ප්‍රකාශය හා එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මුදල් ගලන ප්‍රකාශය, වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශයක් හා පිටු 32 සිට 70 දක්වා වූ වෙනත් කරුණු දැක්වීමේ තොරතුරු අපගේ පරීක්ෂාවට ලක් විය.

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල වගකීම

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ මතයක් ලබා දෙන මෙම මූල්‍යමය ප්‍රකාශන සැකසීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") වගකිව යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන එවැනි අභ්‍යන්තර පාලනයන් වංචා හෝ දෝෂ මගින් ද්‍රව්‍යාත්මක සාවද්‍ය ප්‍රකාශනවලින් තොර මූල්‍ය වාර්තා සැකසීමේ දී අත්‍යවශ්‍ය වේ.

## විගණකවරුන්ගේ විශ්වසනීයත්වය

අපගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම අපගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව අප අපගේ විගණනය සිදු කළෙමු. එකී ප්‍රමිති ආචාරධර්ම අවශ්‍යතාවලට අනුකූලවීමටත්, සැලසුම් කිරීමටත් සාධාරන සහතිකයක් ලබා ගැනීම සදහා මූල්‍ය ප්‍රකාශන ද්‍රව්‍යාත්මක වැරදි ප්‍රකාශ පිළිබඳව විගණනය සිදු කිරීමට අවශ්‍ය කෙරේ.

විගණනය තුළ මූල්‍ය ප්‍රකාශන තුළ ඇති සංඛ්‍යා හා හෙළිදරව්කිරීම් පිළිබදව විගණන සාක්ෂ්‍ය ලබා ගැනීමට සක්‍රීය ක්‍රියාමාර්ග ඇතුළත් විය. මූල්‍ය ප්‍රකාශන වල ද්‍රව්‍යාත්මක වැරදි ප්‍රකාශනවල අවදානම තක්සේරු කිරීම ඇතුළුව විගණක තීන්දුව මත වංචා හෝ අත්වැරැද්දක් තීරණය කිරීමට තෝරාගත් ක්‍රමවේද තිරණය වේ. එම අවදානම් තක්සේරු කිරීම් සිදු කිරීමේදී, ආයතනයේ අභ්‍යන්තර පාලනවල සක්‍රියතාව පිළිබඳව අදහසක් පළ කිරීමේ අරමුණින් නොව, පවත්නා තත්වයන්ට අනුව විගණන ක්‍රමවේද සැලසුම් කිරීමට නිවැරදි හා සාධාරණ අදහසක් ජනිත කරන මූල්‍ය ප්‍රකාශන සැකසීමේ අදාළ අභ්‍යන්තර පාලන විගණකවරයා සැලකිල්ලට ලක් කෙරේ. භාවිත ගිණුම් ප්‍රතිපත්ති වල යෝග්‍යතාවය තක්සේරු කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැකසූ ගිණුම් ඇස්තමේන්තුවල යුක්තිගරුක බව මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම ද විගණනයේදී අවධානයට ලක් කෙරේ.

අපගේ විගණන මතය සදහා පදනමක් සකසා ගැනීමට අප ලබා ගත් විගණන සාක්ෂ්‍ය ප්‍රමාණවත් හා සුදුසු වන බව අපි විශ්වාස කරන්නෙමු.

**මතය**
අප දරන මතය අනුව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මගින් 2015 දෙසැම්බර් 31 දිනට සමූහ ව්‍යාපාරයේ මූල්‍ය තත්වය, එහි මූල්‍ය කාර්යසාධනය පිළිබදව හා එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ගලන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ මතයක් ලබා දේ.

Partners: W R H Fernando FCA FCMA M P D Cooray FCA FCMA R N de Saram ACA FCMA Ms. N A De Silva FCA Ms. Y A De Silva FCA W K B S P Fernando FCA FCMA
Ms. L K H L Fonseka FCA A P A Gunasekera FCA FCMA A Herath FCA D K Hulangamuwa FCA FCMA LLB (Lond) H M A Jayesinghe FCA FCMA
Ms. A A Ludowyke FCA FCMA Ms. G G S Manatunga FCA N M Sulaiman ACA ACMA B E Wijesuriya FCA FCMA

A member firm of Ernst & Young Global Limited





# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

EY
Building a better working world

**වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) හි දක්වා ඇති පරිදි පහත කරුණු අපි ප්‍රකාශ කරන්නෙමු.

අ) විගණනයේ මූලික අදහස, විෂය පථය හා සීමාවන් උක්ත සඳහන් අප අදහස් දැක්වීමේ දක්වා ඇත.

- විගණනයට අවශ්‍ය තොරතුරු හා පැහැදිලි කිරීම් සියල්ල අප ලබා ගත් අතර, අපගේ විමර්ශනයෙන් හෙළිවන අන්දමට සමාගම විසින් නිසි ගිණුම් වාර්තා තබා ගෙන ඇත.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ පිරිවිතර වලට අනුව එදිනෙන් අවසන් වූ වසරේ මූල්‍ය කාර්යසාධනය හා මුදල් ගලන 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ අදහසක් ඇති කරවයි.

- සමාගමේ හා සමූහ ව්‍යාපාරයේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 හා 152 යන වගන්තිවල අවශ්‍යතා හා ගැලපේ.

Ernst & Young

2016 මැයි මස 13 වන දින
කොළඹ දීය

# මූල්‍ය තත්ව ප්‍රකාශනය
## 2015 දෙසැම්බර් 31 දිනට

| | | සමූහ ව්‍යාපාරය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | සටහන | 2015 | 2014 | 2015 | 2014 |
| **වත්කම්** | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල, පිරියත හා උපකරණ | 3 | 10,774,609 | 10,914,371 | 10,694,398 | 10,888,956 |
| ආයෝජනය කළ දේපල | 4 | - | - | 62,771 | - |
| අස්පෘෂ්ඨ වත්කම් | 5 | 14,667 | 16,500 | - | - |
| උප ආයතනවල ආයෝජන | 6 | - | - | 31,320 | 31,320 |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | 7 | 8,937,137 | 9,666,991 | 8,984,222 | 9,714,076 |
| **ජංගම නොවන වත්කම් එකතුව** | | **19,726,413** | **20,597,862** | **19,772,711** | **20,634,352** |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 8 | 1,080,768 | 1,033,028 | 991,083 | 935,136 |
| වෙළෙඳ හා වෙනත් ලැබීමට ඇති දෑ | 9 | 2,964,952 | 2,718,287 | 2,911,877 | 2,753,310 |
| වෙනත් මූල්‍ය වත්කම් | 7 | 3,618,270 | 5,188,005 | 3,435,720 | 5,040,790 |
| මුදල් හා බැංකු ශේෂ | 24 | 4,805,694 | 1,828,119 | 4,781,866 | 1,737,869 |
| **සමස්ත ජංගම වත්කම්** | | **12,469,684** | **10,767,439** | **12,120,546** | **10,467,104** |
| **සමස්ත වත්කම්** | | **32,196,097** | **31,365,301** | **31,893,257** | **31,101,456** |
| **සමකොටස් හා බැරකම්** | | | | | |
| **සමකොටස් හා සංචිත** | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 10 | 1,145,067 | 1,145,067 | 1,145,067 | 1,145,067 |
| සමකොටස්වල වෙනත් අංග | 11 | 7,844,253 | 8,030,467 | 7,864,995 | 8,051,209 |
| රඳවාගත් ඉපයීම් | | 14,861,547 | 14,190,515 | 14,701,790 | 14,045,201 |
| **මව් සමාගමේ සමකොටස්කරුවන්ට ලැබෙන සමකොටස්** | | **23,850,867** | **23,366,049** | **23,711,852** | **23,241,477** |
| පාලනය නොවන පොලී | | 79,866 | 72,969 | - | - |
| **සමස්ත සමකොටස් ප්‍රමාණය** | | **23,930,733** | **23,439,017** | **23,711,852** | **23,241,477** |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| ජංගම නොවන බැරකම | 13 | 110,564 | 194,298 | 110,511 | 194,624 |
| විලම්බිත ආදායම | 14 | 3,845,322 | 3,516,111 | 3,845,321 | 3,516,111 |
| සේවක විශ්‍රාම ප්‍රතිලාභ | 15 | 720,649 | 680,536 | 719,751 | 679,833 |
| **ජංගම නොවන බැරකම් එකතුව** | | **4,676,535** | **4,390,945** | **4,675,583** | **4,390,569** |
| **ජංගම බැරකම්** | | | | | |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 16 | 2,780,492 | 2,600,065 | 2,697,393 | 2,534,019 |
| ආදායම් බදු බැරකම් | | 750,098 | 922,908 | 750,190 | 923,026 |
| බැංකු අයිරා | 12 | 58,239 | 12,365 | 58,239 | 12,365 |
| **සමස්ත ජංගම බැරකම්** | | **3,588,829** | **3,535,338** | **3,505,822** | **3,469,411** |
| **සමකොටස් හා බැරකම්** | | **32,196,097** | **31,365,301** | **31,893,257** | **31,101,456** |

මෙම ගිණුම් ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති හා අනුගත වන බවට මම සහතික කරමි.

..........................................
ප්‍රධාන මූල්‍ය නිලධාරි

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේ හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස එය නියෝජනය කරමින් අත්සන් තබන ලදී.

..........................................
අධ්‍යක්ෂ

..........................................
අධ්‍යක්ෂ

පිටු 38 සිට 70 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසකි.

2016 මැයි 13 දින
කොළඹ දී ය.



# ලාභාලාභ ප්‍රකාශනය
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය

| | | සමූහ ව්‍යාපාරය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | සටහන | 2015 රු.'000 | 2014 රු.'000 | 2015 රු.'000 | 2014 රු.'000 |
| ආදායම | 17 | 26,774,028 | 24,332,107 | 26,193,589 | 23,780,990 |
| අලෙවි පිරිවැය | | (23,407,018) | (20,523,201) | (22,884,281) | (20,050,127) |
| **දළ ලාභය** | | **3,367,009** | **3,808,905** | **3,309,308** | **3,730,862** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 18 | 707,373 | 613,988 | 709,098 | 611,788 |
| මෙහෙයුම් වියදම් | | (1,775,009) | (1,746,918) | (1,774,957) | (1,737,895) |
| පරිපාලන වියදම් | | (1,808,266) | (1,655,305) | (1,790,939) | (1,634,002) |
| මූල්‍ය ආදායම | 19 | 1,032,844 | 1,286,990 | 1,019,768 | 1,275,339 |
| මූල්‍ය පිරිවැය | 20 | (15) | (7,481) | (15) | (7,481) |
| **බදු පෙර ලාභය** | **21** | **1,523,935** | **2,300,178** | **1,472,263** | **2,238,612** |
| ආදායම් බදු (වියදම)/ආපසු | 22 | (261,964) | (695,753) | (246,033) | (683,688) |
| **වසරේ ලාභය** | | **1,261,971** | **1,604,425** | **1,226,230** | **1,554,924** |
| **අදාළත්වය:** | | | | | |
| මව් සමාගමේ සමකොටස් කරුවන් | | 1,249,470 | 1,586,105 | | |
| පාලනය නොවන පොලී | | 12,501 | 18,320 | | |
| | | **1,261,971** | **1,604,425** | | |
| කොටසක මූලික ඉපයුම | 23 | 10.91 | 13.85 | 10.71 | 13.58 |

පිටු 38 සිට 70 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත කොටසකි.

# වෙනත් සම්ප්‍රේෂණ ආදායම් ප්‍රකාශය

## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

| | සටහන | සමූහ ව්‍යාපාරය | | සමාගම | |
|---|---|---|---|---|---|
| | | 2015<br>රු.'000 | 2014<br>රු.'000 | 2015<br>රු.'000 | 2014<br>රු.'000 |
| **වසරේ ලාභය** | | 1,261,971 | 1,604,425 | 1,226,230 | 1,554,924 |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | | | |
| **වෙනත් විස්තීරණ ආදායම - පසුකාලීනව ලාභ හෝ අලාභ ලෙස ප්‍රතිවර්ගීකරණය කෙරෙන** | | | | | |
| ශුද්ධ වාසිය/ (පාඩුව) - අලෙවිය සඳහා ඇති මූල්‍ය වත්කම් | | (186,214) | 6,281,953 | (186,214) | 6,281,953 |
| **ශුද්ධ වෙනත් විස්තීරණ ආදායම - පසුකාලීනව ලාභ හෝ අලාභ ලෙස ප්‍රතිවර්ගීකරනය කෙරෙන** | | **(186,214)** | **6,281,953** | **(186,214)** | **6,281,953** |
| **වෙනත් විස්තීරණ ආදායම - පසුකාලීනව ලාභ හෝ අලාභ ලෙස ප්‍රතිවර්ගීකරණය නොකරන (බදු හැර)** | | | | | |
| වෙආයුෂණක වාසිය /(පාඩුව) විශ්‍රාම ප්‍රතිලාභ | | (19,519) | (90,230) | (19,507) | (90,230) |
| ඉඩම් හා ගොඩනැගිලි - ප්‍රතිඇගයු | | | 279,899 | - | 325,641 |
| **ශුද්ධ වෙනත් විස්තීරණ ආදායම - පසුකාලීනව ලාභ හෝ අලාභ ලෙස ප්‍රතිවර්ගීකරණය කෙරෙන** | | **(19,519)** | **189,669** | **(19,507)** | **235,411** |
| **වසරේ වෙනත් විස්තීරණ ආදායම් - බදු හැර** | | **(205,733)** | **6,471,622** | **(205,721)** | **6,517,364** |
| **වසරේ සමස්ත වෙනත් විස්තීරණ ආදායම් - බදු හැර** | | **1,056,239** | **8,076,047** | **1,020,510** | **8,072,289** |

පිටු 38 සිට 70 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත කොටසකි.





# සමකොටස් වෙනස්වීමේ ප්‍රකාශනය

## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

| සමාගම | ප්‍රකාශිත ප්‍රාග්ධනය<br>රු.'000 | සංචිත සඳහා ඇති ආදායම<br>රු.'000 | ඉපැයුම් අලෙවි සංචිතය<br>රු.'000 | ප්‍රතිතක්සේරු සංචිතය<br>රු.'000 | ඉපැයුම් අලෙවි සංචිතය<br>රු.'000 | එකතුව<br>රු.'000 | Non Cotrolling Interest<br>රු.'000 | Total Equity<br>රු.'000 |
|---|---|---|---|---|---|---|---|---|
| **2014 ජනවාරි 01 දිනට ශේෂය** | 1,145,067 | 449,900 | 12,642,634 | 1,127,974 | - | 15,365,575 | 56,125 | 15,421,700 |
| වසරේ ලාභය | - | - | 1,586,105 | - | - | 1,586,105 | 18,320 | 1,604,425 |
| වෙනත් විස්තීරණ ආදායම (බදු හැර) | - | - | (90,230) | 279,899 | 6,281,953 | 6,471,622 | - | 6,471,622 |
| **සමස්ත විස්තීරණ ආදායම** | **-** | **-** | **1,495,875** | **279,899** | **6,281,953** | **8,057,727** | **18,320** | **8,076,047** |
| සමකොටස් ගෙවීම | - | - | (57,253) | - | - | (57,253) | (1,476) | (58,730) |
| විදේශ විනිම සංචිතය මාරුකිරීම - රඳවාගත් ඉපයීම් වලට | - | (109,258) | 109,258 | - | - | - | - | - |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,145,067** | **340,642** | **14,190,515** | **1,407,873** | **6,281,953** | **23,366,050** | **72,969** | **23,439,018** |
| සුපර් ගෙයින් බද්ද | - | - | (397,957) | - | - | (397,957) | (3,725) | (401,682) |
| වසරේ ලාභය | - | - | 1,249,470 | - | - | 1,249,470 | 12,501 | 1,261,971 |
| වෙනත් විස්තීරණ ආදායම (බදු හැර) | - | - | 19,519 | - | (186,214) | (166,695) | - | (166,695) |
| **සමස්ත විස්තීරණ ආදායම** | **-** | **-** | **871,032** | **-** | **(186,214)** | **684,818** | **8,776** | **693,594** |
| ලාභාංශ ගෙවීම | | | (200,000) | - | - | (200,000) | (1,879) | (201,879) |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,145,067** | **340,642** | **14,861,547** | **1,407,873** | **6,095,739** | **23,850,868** | **79,866** | **23,930,733** |

පිටු 09 සිට 44 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත කොටසකි.

| සමාගම | ප්‍රකාශිත ප්‍රාග්ධනය<br>රු.'000 | සංචිත සඳහා තබා ඇති ආදායම<br>රු.'000 | ප්‍රතිතක්සේරු සංචිතය<br>රු.'000 | ඉපැයුම් අලෙවි සංචිතය<br>රු.'000 | ප්‍රතිතක්සේරු සංචිතය<br>රු.'000 | එකතුව<br>රු.'000 |
|---|---|---|---|---|---|---|
| **2014 ජනවාරි 01 දිනට ශේෂය** | 1,145,067 | 449,900 | 12,528,503 | (25,001) | 1,127,974 | 15,226,443 |
| වසරේ ලාභය | - | - | 1,554,924 | - | - | 1,554,924 |
| වෙනත් විස්තීරණ ආදායම (බදු හැර) | - | - | (90,230) | 6,281,953 | 325,641 | 6,517,364 |
| **සමස්ත විස්තීරණ ආදායම** | **-** | **-** | **1,464,694** | **6,281,953** | **325,641** | **8,072,288** |
| ලාභාංශ ගෙවීම | - | - | (57,253) | - | - | (57,253) |
| විදේශ විනිම සංචිතය මාරුකිරීම - රඳවාගත් ඉපයීම් | - | (109,258) | 109,258 | - | - | - |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,145,067** | **340,642** | **14,045,201** | **6,256,952** | **1,453,615** | **23,241,479** |
| සුපර් ගෙයින් බද්ද | - | - | (389,148) | - | - | (389,148) |
| වසරේ ලාභය | - | - | 1,226,230 | - | - | 1,226,230 |
| වෙනත් විස්තීරණ ආදායම (බදු හැර) | - | - | 19,507 | (186,214) | - | (166,707) |
| **සමස්ත විස්තීරණ ආදායම** | **-** | **-** | **856,589** | **(186,214)** | **-** | **670,375** |
| ලාභාංශ ගෙවීම | - | - | (200,000) | - | - | (200,000) |
| විදේශ විනිම සංචිතය මාරුකිරීම - රඳවාගත් ඉපයීම් | - | - | - | - | - | - |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **1,145,067** | **340,642** | **14,701,790** | **6,070,738** | **1,453,615** | **23,711,852** |

පිටු 38 සිට 70 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත කොටසකි.

# මූල්‍ය ගලන ප්‍රකාශය
## 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය

| | සටහන | සමූහ ව්‍යාපාරය 2015 රු.'000 | සමූහ ව්‍යාපාරය 2014 රු.'000 | සමාගම 2015 රු.'000 | සමාගම 2014 රු.'000 |
|---|---|---|---|---|---|
| **මුදල් ගලන / (භාවිත) - මෙහෙයුම් කටයුතු** | | | | | |
| බදු පෙර ලාභය / (පාඩුව) | | 1,523,935 | 2,300,178 | 1,472,263 | 2,238,612 |
| බදු පෙර ලාභය / (පාඩුව) | | | | | |
| ගැලපුම් කළ ක්ෂයවීම් - දේපල, පිරියත හා උපකරණ | 3 | 878,081 | 854,207 | 868,695 | 842,682 |
| ක්ෂයවීම් - ආයෝජිත දේපල | | - | - | 510 | - |
| අස්පෘෂ්ඨ වත්කම් ක්‍රමක්ෂය | | 1,833 | 1,833 | - | - |
| ලාභාලාභ වලට බැරකළ ප්‍රතිතක්සේරු ආපසුගැනීම් | | - | (16,221) | - | (16,221) |
| මූල්‍ය ආදායම | 17 | (1,032,844) | (1,286,990) | (1,019,768) | (1,275,339) |
| දේපල, පිරියත හා උපකරණ අලෙවියේ (ලාභ)/ පාඩුව | 21 | (52,425) | - | (52,418) | - |
| මූල්‍ය පිරිවැය | 19 | 15 | 7,481 | 15 | 7,481 |
| විලම්බිත ආදායම් ක්‍රමක්ෂය | 13 | (307,107) | (286,447) | (307,107) | (286,448) |
| විශ්‍රාම ප්‍රතිලාභ සැළසුම් සඳහා ප්‍රතිපාදන | 14 | 98,454 | 89,264 | 98,246 | 88,869 |
| **මෙහෙයුම් ලාභය/(පාඩුව) - කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පසු මෙහෙයුම් වලින් උපයාගත් මුදල** | | **1,109,943** | **1,663,307** | **1,060,435** | **1,599,635** |
| (වැඩිවීම)/ අඩුවීම - තොග | | (47,740) | (122,189) | (55,947) | (128,076) |
| (වැඩිවීම)/ අඩුවීම - වෙළඳ හා වෙනත් ලැබිය යුතුදෑ | | (67,921) | 168,256 | 20,176 | 163,747 |
| (වැඩිවීම)/ අඩුවීම - වෙනත් මූල්‍ය වත්කම් | | 2,139,735 | (1,836,945) | 2,175,070 | (1,689,730) |
| වැඩිවීම/(අඩුවීම) - වෙළඳ හා වෙනත් ගෙවිය යුතු | | 180,427 | (3,200,016) | 163,374 | (3,168,528) |
| **මෙහෙයුම් වලින් උපයාගත් මුදල** | | **3,314,444** | **(3,327,588)** | **3,363,108** | **(3,222,952)** |
| ගෙවූ පොලිය | | (15) | (7,481) | (15) | (7,481) |
| ස්ථිර ප්‍රතිලාභ සැළසුම් පිරිවැය - ගෙවනලද | | (31,236) | (27,734) | (31,236) | (27,665) |
| ගෙවූ ආදායම් බදු | | (488,515) | 7,150 | (472,990) | (16,584) |
| ගෙවූ සුපර් ගෙයින් බද්ද | | (397,957) | - | (389,148) | - |
| **ශුද්ධ මුදල - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්/(භාවිත)** | | **2,396,721** | **(3,355,653)** | **2,469,719** | **(3,274,683)** |
| **මුදල් ගලන - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්/(භාවිත)** | | | | | |
| ශුද්ධ අත්පත්කර ගැනීම් හා දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීම | | (794,701) | (1,073,934) | (726,798) | (1,073,779) |
| ආයෝජන දේපල අත්පත් කර ගැනීම | | - | - | (63,281) | - |
| ආයෝජන/ (අයවීම්) - ජංගම නොවන ආයෝජන වලින් | | (26,360) | 870,109 | (26,360) | 870,109 |
| ලත් මුදල් ආදායම | | 1,032,844 | 1,286,990 | 1,019,768 | 1,275,339 |
| ලත් විලම්බිත ආදායම | | 525,074 | 547,739 | 525,074 | 547,739 |
| ශුද්ධ මුදල - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්/(භාවිත) | | **736,857** | **1,630,904** | **728,404** | **1,619,409** |
| **ශුද්ධ වැඩිවීම/(අඩුවීම) - මුදල් හා මුදල් වලට සමාන දෑ** | | | | | |
| මුදල් හා මුදල්වලට සමාන දෑ - වසර ආරම්භයේ | | (201,879) | (58,730) | (200,000) | (57,253) |
| ලාභාංශ ගෙවීම පොලී සහිත ණය හා ණයට ගැනීම් පියවීම | 11 | - | (56,026) | - | (56,026) |
| **ශුද්ධ මුදල් ගලන /(භාවිත) - මූල්‍ය ක්‍රියාකාරකම් වලින්** | | **(201,879)** | **(114,756)** | **(200,000)** | **(113,279)** |
| **ශුද්ධ වැඩිවීම/(අඩුවීම) - මුදල් හා මුදල් වලට සමාන දෑ** | | 2,931,699 | (1,839,506) | 2,998,123 | (1,768,554) |
| **මුදල් හා මුදල්වලට සමාන දෑ - වසර ආරම්භයේ** | | 1,815,754 | 3,655,258 | 1,725,503 | 3,494,058 |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ - වසරාවසාන** | 24 | **4,747,454** | **1,815,754** | **4,723,626** | **1,725,503** |

පිටු 38 සිට 70 දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත කොටසකි.






# අන්තර්ක්‍රියාකාරී අන්තර්ජාල පදනම් වූ සේවාදායක පෝටලය

තම මනුව කියවීමේදී, ඔවුන්ගේ පාරිභෝජනය පාලනය කිරීමේ දී සහ උපයෝගිතාවය සමඟ සංනිවේදනය කිරීමේ දී අපගේ අන්තර්ජාල පෝටලය සමඟ කටයුතු කිරීමට සේවාදායකයන්හට හැකි වනු ඇත. අපගේ පාරිභෝගික සේවාවන් ඔවුන් සමීපයටම ගෙන යාමට කටයුතු කෙරෙනු ඇත.

# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

### 1. ආයතනික තොරතුරු
### 1.1 පොදු

සී/ස ලංකා විදුලි (පෞද්,) සමාගම යනු ශ්‍රී ලංකාවේ සංස්ථාගත, ස්ථාපනය කර ඇති සීමාසහිත බැරකම් සහිත සමාගමකි. එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 03, ගාලු පාරේ, ඊ.එච්. කුරේ ගොඩනැගිල්ලේ, අංක 411 යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ සී/ස ලංකා විදුලි (පෞද්,) සමාගමේ (සමාගම) සහ එහි ඒකාබද්ධව ගිණුම් කරගෙන යන උප ආයතන (සමූහ ව්‍යාපාරය) සියල්ලේම ඇතුළත් වේ.

### 1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

අදාළ වසර තුළ සමාගමේ ප්‍රධාන කර්තව්‍යයන් වූයේ ලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලිය මිලදී ගැනීම හා ගාල්ල, කළුතර, මොරටුව, කැලණිය, නුගේගොඩ, කෝට්ටේ හා මීගමුවේ පිහිටි සමාග මේ ශාඛා මගින් ගෘහමය හා කර්මාන්තමය පාරිභෝගිකයන් හට සිල්ලරව ලබා දීමයි.

සමාගමේ උප ආයතන හා ඒවායේ ප්‍රධාන කාර්යභාරයන් පහත දක්වා ඇත.

| සමාගම | ක්‍රියාකාරකම |
|---|---|
| සී/ස ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පෞද්.) සමාගම | රට තුළ විදුලිය බෙදා හැරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම |
| සී/ස ඇන්ටි ලෙකෝ මීටරින් (පෞද්.) සමාගම | ශ්‍රී ලංකාවේ ඉලෙක්ට්‍රොනික් මනු අවශ්‍යතා සපුරා ගැනීමට හා විදේශීය වෙළෙඳපොළ සඳහා බලශක්ති මනු නිෂ්පාදනාගාරයක් ඉදිකිරීම |

### 1.5 මූල්‍ය ප්‍රකාශනවල වගකීම

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති හා 2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව සමූහ ව්‍යාපාරයේ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ.

### 1.6 මූල්‍ය ප්‍රකාශන වලට අධ්‍යක්ෂ අනුමැතිය

2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ සමූහ ව්‍යාපාරයේ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2016 මැයි 13 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර ලබා දෙන ලදි.





# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

### 2. සැකසීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය තත්වය, ලාභ අලාභ තත්වය, වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය, සමකොටස් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ගලන ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් සමූහ ව්‍යාපාරයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන හා සමාගමට අදාළ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති (SLFRS හා LKAS) හා 2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්තිවලට අනුව සකසා ඉදිරිපත් කර ඇත.

### 2.2 මැනීමේ පදනම

සමූහ ව්‍යාපාරයේ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පහත දැක්වෙන ද්‍රව්‍යාත්මක අයිතම හැර අනෙක් ඒවා ඓතිහාසික පිරිවැය පදනම අනුව සකසා ඇත.

- අලෙවිය සදහා ඇති ආයෝජන සාධාරණ වටිනාකමට ගණනය කෙරේ.
- පවරා ගන්නා අවස්ථාවේ පිරිවැයට ගණනය කරන ලද පසුව ප්‍රතිඅගය කළ මුදලට ඇස්තමේන්තු කළ ඉඩම හා ගොඩනැගිලිවල ප්‍රතිඅයකළ දිනට සාධාරණ අගයන් වේ.
- ස්ථිර ප්‍රතිලාභ බැඳීම් සඳහා වූ බැරකම් ස්ථිර ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් අගයට හඳුනා ගෙන ඇත.

### 2.3 ක්‍රියාකාරිත්ව හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

සමූහ ව්‍යාපාරයේ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන සී/ස ලංකා විදුලි (පෞද්.) සමාගම කටයුතු කරන මූලික ආර්ථික වටපිටාව තුල ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති මූල්‍ය තොරතුරු වෙනත් ආකාරයේ ලෙස දක්වා තිබිම් හැර ආසන්න දහසට සකසා ඇත. සමූහ ව්‍යාපාරයේ ඉදිරිපත් කිරීම් වල හා ක්‍රියාකාරිත්ව ව්‍යවහාර මුදල කිසිදු වෙනසක් සමාලෝචිත වසර තුළ සිදු වී නොමැත.

### 2.4 ද්‍රව්‍යාත්මකබව හා ඒකරාශීවීම

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතියට - LKAS 01 ට අනුකූලව, (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම), සමාන අයිතම වල එක් එක් ද්‍රව්‍යාත්මක පංතිය මූල්‍ය ප්‍රකාශන වල වෙන්ව දක්වා ඇත. සමාන නොවන වර්ගවල අයිතම හෝ කාර්යයන් ද අද්‍රව්‍ය ඒවා හැර වෙන් වෙන්ව දක්වා ඇත.

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කර මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දක්වා ඇති ශුද්ධ මුදල මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කර මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දක්වා ඇති ශුද්ධ මුදල නෛතිකව ඇති හිමිකම මත පමණක් හදුනාගත් මුදල් හිලව් කර ඇත. ශුද්ධ පදනම මත පියවීමට හෝ වත්කම් විකිණීමට හා බැරකම් එකවර පියවීමට අදහස් කර ඇත. ආදායම හා වියදම් අවශ්‍ය වුවහොත් හෝ ගිණුම් ප්‍රමිතියකින් අවසර දෙන්නේනම් හැර ලාභාලාභ ප්‍රකාශනයේ හිලව් නොකෙරේ.

### 2.5 සංසන්දනාත්මක තොරතුරු

සමාගම ගිණුම් ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිතා කරන අතර ඒවා පසුගිය වසරේ භාවිත කළ ඒවා සමඟ ගැලපේ.

### 2.6 ප්‍රධාන ගිණුම් තීරණ, ඇස්තමේන්තු හා උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූල සමූහ ව්‍යාපාරයේ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී කළමනාකාරිත්වයට ගිණුම් ප්‍රතිපත්ති යොදා ගැනීමට හා වත්කම්, බැරකම් තුඩු දෙන තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන යොදා ගැනීමට අවශ්‍ය වේ.

එසේ වුවද, මෙම පරිකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ අස්ථිරභාවය මගින් ඉදිරි කාලවලදී බලපාන වත්කමක හෝ බැරකමක ධාරන අගයට ද්‍රව්‍යාත්මක ගැලපීමක් ඇති විය හැකිය.

ඇස්තමේන්තු හා ඒවාට අදාළ උපකල්පන අඛණ්ඩව විමර්ශනයට ලක් කෙරේ. ගිණුම් ඇස්තමේන්තු සංශෝධන ඇස්තමේන්තුව සංශෝධනය කළ කාලසීමාව තුළ දි හා කිසියම් හෝ බලපාන ලද අනාගත කාලසීමාවන්වල හඳුනා ගැනේ.

සමූහ ව්‍යාපාරයේ හා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති මුදල්වලට ප්‍රධාන ලෙසම බලපෑම් ඇති කරන ගිණුම් ප්‍රතිපත්ති භාවිත කිරීමේ දී ඇස්තමේන්තු සැකසීම, අස්ථිරතාවය හා තීරණාත්මත තීන්දුවල ප්‍රධාන ක්ෂේත්‍ර පහත දක්වා ඇත.

# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

### 2.6.1 අඛණ්ඩභාවය

අඛණ්ඩභාවය තබා ගැනීමට සමූහ ව්‍යාපාරයට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් අධ්‍යක්ෂවරුන් විසින් සිදු කර දීර්ඝ අනාගත කාලයක් වන තෙක් ව්‍යාපාරය පවත්වාගෙන යාමට සම්පත් ඇතිබව පිළිබඳව සෑහීමට පත් ව සිටී. තවද, සමූහ ව්‍යාපාරයේ අඛණ්ඩතාවය රඳවා ගැනීමේ හැකියාව පිළිබදව සැලකියයුතු සැකයක් උපදවන ද්‍රව්‍යායාත්මක අස්ථිරතා ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය නොදන්නා බවත් ඔවුන් සමූහ ව්‍යාපාරය ඈවර කිරීමට හෝ මෙහෙයුම් නවතා ලීමට අදහස් නොකෙරේ. එබැවින්, අඛණ්ඩ පදනම මත මූල්‍ය ප්‍රකාශන ඉදිරියටත් සැකසෙනු ඇත.

### 2.6.2 වෙළඳ ලැබීමට නියමිත සඳහා අපවයවීමේ ප්‍රතිපාදන

සමූහ ව්‍යාපාරය හා සමාගම තම වෙළඳ ලැබීමට නියමිත දෑහි අපවයවීමේ පාඩුව දන්වා සිටින දිනට ලාභාලාභ ප්‍රකාශනයේ සදහන් කළ යුතු දැයි වෙන් වෙන්ව විමර්ශනය කෙරේ. අපවයවීමේ පාඩුව සාධක කිහිපයක් මත තීරණය වන බැවින් ප්‍රමාණය ගණනය කිරීමේ දී කළමනාකාරිත්වයේ තීන්දුව විශේෂයෙන්ම වැදගත් වේ. මෙම ඇස්තමේන්තු සාධක කිහිපයක් මත පදනම් වන බැවින් හා සත්‍ය ප්‍රතිඵල වෙනස් විය හැකි බැවින් අපවයවීමේ ප්‍රතිපාදනවල ඉදිරි වෙනස්කම් සිදු කර ඇත.

### 2.6.3 දැනට ඇති අලෙවි ආයෝජන අපවයවීම

සමූහ ව්‍යාපාරය හා සමාගම එක් එක් දන්වා සිටින දිනට විකුණුම් ආයෝජන ලෙස වර්ග කර ඇති තම මිලගණන් ඉදිරිපත් නොකළ සමකොටස් ආයෝජන අපවය වී ඇත්දැයි සෙයා බැලේ. අලෙවි ආයෝජන මූලික ඇති බවට විෂය මූලික සාක්ෂ්‍යය තුළ ආයෝජනයක සාධාරණ අගය එහි පිරිවැයට වඩා කුමන ප්‍රමාණයකට අඩුවී තිබේදැයි සඳහන් කෙරේ.

### 2.6.4 ලබාගත හැකි අලෙවි ආයෝජන වල සාධාරන වටිනාකම

කිසිදු අලෙවි මිලක් දැකිය නොහැකි මූල්‍ය තත්ව ප්‍රකාශනයේ අලෙවි ආයෝජන ලෙස දක්වා ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගය තීරණය කිරීම සඳහා තක්සේරු ශිල්පීය ක්‍රම යොදා ගැනේ. විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල 7 වන සටහනේ විස්තරාත්මකව දක්වා ඇත.

ගණනය කිරීම් සිදු කිරීමේ දී භාවිත කරන යෙදවුමේ වැදගත්කම හුවා දක්වන සාධාරණ අග භාවිතා කරමින් සමූහ ව්‍යාපාරය සාධාරන අගයන් තීරණය කෙරේ. සාධාරණ අගය ධූරාවලිය මූල්‍ය ප්‍රකාශන වල 7 වන සටහනේ දක්වා ඇත.

### 2.6.5 ස්ථිර ප්‍රතිලාභ සැලසුම්

ස්ථිර ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය හා ඒවායේ බැඳීම් වල තථ්‍ය අගය ආයුඝණක තක්සේරු භාවිත කර තීරණය කෙරේ. ආයුඝණක තක්සේරු කිරීමේ දී වට්ටම් අනුපාත, ඉදිරි වැටුප් වැඩිවීම්, මර්තයතා අනුපාත පිළිබඳ උපකල්පන අවධානයට යොමු කෙරේ. මෙකී සැලසුම්වල දිගුකාලීන බව හේතුකොටගෙන, එවැනි ඇස්තමේන්තු ප්‍රධාන අස්ථිරතාවලට භාජනය වේ. උපකල්පන සියල්ල දන්වා සිටින දිනයට සමාලෝචනයට ලක් කෙරේ.

ගැලපෙන වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී, ස්ථිර ප්‍රතිලාභ බැඳීම්වල අපේක්ෂිත කාලය අදාළ වන ශ්‍රී ලංකා රජයේ කල් පිරුණු බැදුම්කර කෙරෙහි කළමනාකාරිත්වය සැලකිලිමත් වේ. මර්තයතා අනුපාතය පොදුවේ දක්වන ඇති මර්තයතා වගු මත පදනම් වී ඇත. සමාගමේ අනාගත වැටුප් වැඩිවීමේ අනුපාතය ඉදිරි වැටුප් වැඩිවීම් මත තීරණය වේ.

### 2.6.6 දේපල, පිරියත හා උපකරණවල සාධාරණ අගය

සමාගමේ හා සමූහ ව්‍යාපාරයේ ඉඩම හා ගොඩනැගිලි සාධාරණ අගයට දක්වා ඇත. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති - SLFRS 13, (සාධාරණ වටිනාකම ගණනය) වලට අනුකූලව ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ වටිනාකම තීරණය කිරීම සදහා සමූහ ව්‍යාපාරය ස්වාධීන තක්සේරු ප්‍රවීණයන්ගේ සේවා ලබා ගනී.

### 2.6.7 දේපල, පිරියත හා උපකරණවල භාවිත ආයුකාලය

සමූහ ව්‍යාපාරය හා සමාගම ශේෂවන අගය, භාවිත ආයුකාලය සහ දේපල, පිරියත හා උපකරණවල ක්ෂයවීමේ ක්‍රම දන්වා සිටින එක් එක් දිනට විමර්ශනය කෙරේ. මෙම අගයන්, අනුපාත හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේ දී කළමනාකාරිත්වයේ තීරණයට ලක් කරන බැවින් ඒවා අස්ථාවරත්වයට පත් වේ.

### 2.6.8 බැඳීම් හා හදිසි අවස්ථා

දක්වා ඇති බැරකම් සියල්ලේ වටිනාකම තීරණය කිරීමේ දි දැනෙන අවදානම් සියල්ල සැලකිල්ලට ලක් කෙරේ.

අවිනිශ්චිත බැරකම් යනු ආර්ථික ප්‍රතිලාභය මාරුකළ නොහැකි හෝ විශ්වසනීය ලෙස මැණිය නොහැකි අස්ථිර අනාගත සිදුවීම් හෝ තථ්‍ය බැඳීම් මත පමණක් පැවැත්ම රදා පවතින වියහැකි බැඳීම් වේ. අවිනිශ්චිත බැරකම් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන නොතිබුනද, ඒවායේ අදාළත්වය මත හෙළිදරව් කර ඇත.





# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

### 2.7 ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්ති

සමූහ ව්‍යාපාරය හා සමාගම මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අනුගමනය කළ ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්ති පහත දක්වා ඇත. පහත සඳහන් භාවිත කළ ගිණුම් ප්‍රතිපත්ති සමූහ ව්‍යාපාරයේ හා සමාගමේ මෙම මූල්‍ය ප්‍රකාශන වල එසේ නොවන බවට ප්‍රකාශක නොමැතිනම් සියලු කාලවලට අදාළව අඛණ්ඩව ඉදිරිපත් කර ඇත.

### 2.7.1 තහවුරුකිරීමේ පදනම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ සමූහ ව්‍යාපාරයේ හා එහි උප ආයතනවල 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන ඇතුළත් වේ.

සමූහ ව්‍යාපාරය අනාවරණය වූ විට, හෝ හිමිකම් ඇති විට, ආයෝජන ලබන්නා සමග කටයුතුවලින් ලැබෙන වෙනස්වූ ආදායම් ලැබෙන විට හා ආයෝජනය ලබන්නා මත බලපෑම් කර එමගින් එකී ප්‍රතිලාභවලට බලපෑමක් කිරීම මත පාලනයක් සිදු වේ. විශේෂයෙන්ම ආයෝජනය ලබන්නා සහ සමූහ ව්‍යාපාරය පහත අවස්ථාවල පාලනයක් ඇති විටක.

- ආයෝජනය ලබන්නා මත බලය යෙදීම (උදා - ආයෝජන ලබන්නාගේ අදාළ ක්‍රියාකාරකම් මෙහෙයවීමේ තථ්‍ය හැකියාව ඇති දැනට ඇති බලතල)
- ආයෝජනය ලබන්නා සමග කටයතු කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභවලට ඇති ඉඩකඩ, හෝ හිමිකම
- ප්‍රතිලාභවලට බලපෑමක් කරන ආයෝජනය ලබන්නාට බලය පාවිච්චි කිරීමේ හැකියාව

පොදුවේ ගත්කල, කැමැත්ත පළකිරීමේ හිමිකම් වැඩි ප්‍රමාණයක් පාලනය වන බවට පූර්ව නිගමනයක් ඇත. ආයෝජකයෙකුට ඇති කැමැත්ත පළකිරීමේ හෝ සමාන හිමිකම්වල වැඩි ප්‍රමාණයක් සමූහ ව්‍යාපාරය සතු වන අවස්ථාවක සමූහ ව්‍යාපාරය අදාළ සියලු විස්තර හා තත්වයන් සලකා බලා පහත දැක්වෙන කරුණු ඇතුළුව ආයෝජකයාට ඇති හැකියාවන් සොයා බැලේ.

- ආයෝජකයෙකුගේ වෙනත් කැමැත්ත පළකරන්නන් සමග වූ කොන්ත්‍රාත්තුමය තත්වයන්
- වෙනත් කොන්ත්‍රාත්තුමය කටයුතු මගින් අත්වන හිමිකම්
- සමූහ ව්‍යාපාරයේ කැමැත්ත පළ කිරීමේ හිමිකම් හා විභව කැමැත්ත පළ කිරීමේ හිමිකම්

පාලන අංග තුනෙන් එකක හෝ වැඩි ප්‍රමාණයක වෙනස්කම් දක්වන අවස්ථාවක ආයෝජකයෙකු සමූහ ව්‍යාපාරයට පාලනයවීම එය විසින් ප්‍රතිතක්සේරුවකට ලක් කෙරේ. උප ආයතනයක පාලනය සමූහ ව්‍යාපාරය අතට ගැනීම හා උප ආයතනය පාලනය සමූහ ව්‍යාපාරයට අහිමිවීමත් සමග උප ආයතනයක් ඒකාබද්ධ කරගැනීම ඇරඹේ. වසර තුළ උප ආයතනයක් විසින් අත්පත්කරගත් හෝ විකුණා දැමූ දේපල, බැරකම්, ආදායම හා වියදම් සමූහ ව්‍යාපාරය පාලනය භාරගත් දින සිට උප ආයතනයේ පාලනය නවත්වන දින දක්වා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කෙරේ.

ලාභය හෝ පාඩුව හා වෙනත් විස්තීරණ ආදායමෙහි (OCI) එක් එක් අංග සමූහ ව්‍යාපාරයේ මව් සමාග මේ සමකොටස් දරන්නන්ට සහ පාලනය කළ නොවන ලැදිකම් ඒවා මගින් ඌන ශේෂයක් ඇති වුවද ඒවාට හිමිකම ඇත. උප ආයතනවල ගිණුම් ප්‍රතිපත්ති සමූහ ව්‍යාපාරයේ ගිණුම් ප්‍රතිපත්තිවලට සමපාත කිරීම අවශ්‍ය අවස්ථාවලදී උප ආයතනවල මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් සිදු කෙරේ.

සමූහ ව්‍යාපාරය තුළ ඇති සියලුම වත්කම් හා බැරකම්, සමකොටස්, ආදායම, වියදම් හා සමූහ ව්‍යාපාරයේ සාමාජිකයන් අතර වන ගනුදෙනුවලට අදාළ මුදල් ගලන ඒකාබද්ධ කිරිමේ දී සම්පූර්ණයෙන්ම බැහැර කෙරේ. පාලනය අහිමිවීමකින් තොර උප ආයතනයක හිමිකම පිළිබද තත්වයක් වෙනස් වූ අවස්ථාවක සමකොටස් ගනුදෙනුවක් ලෙස සලකනු ලැබේ.

කිසියම් උප ආයතනයක පාලනය සමූහ ව්‍යාපාරයට අහිමිවන අවස්ථාවකදී, අදාළ වත්කම් (හොඳහිත ඇතුළුව) බැරකම්, පාලනයෙන් තොර බැඳියාවන් හා සමකොටස්වල වෙනත් අංග ලාභ හෝ අලාභවලදී ඇති වන ලෙස හඳුනාගන්නා කිසියම් වාසි හෝ අවාසි සමූහ ව්‍යාපාරය විසින් හඳුනා නොගනී. රඳවාගත් කිසියම් ආයෝජන සාධාරණ වටිනාකමට හඳුනා ගැනේ. ඒකාබද්ධ කර ගැනීමේ දී සී/ස ඇන්ටෙ ලෙකෝ මීටරින් (පෞද්.) සමාගම සහ සී/ස ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පෞද්.) සමාගම උප ආයතනයක් ලෙස සැලකේ. ඊට හේතුව සී/ස. ලංකා විදුලි (පෞද්.) සමාගම සතුව කැමැත්ත පළ කිරීමේ වැඩි හිමිකමක් හා එම සමාගම් පාලනය කිරීමක් සිදු කිරීමයි.

### 2.7.2 විදේශ මුදල් ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් සියල්ලම ගනුදෙනු සිදු වන දිනය වන විට පවතින විනිමය අනුපාත අනුව භාවිත මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරේ.

විදේශීය මුදල් ලෙස දන්වා සිටින දිනය වන විට පවතින මූල්‍ය වත්කම් හා බැරකම් තත්කාලීන විදේශ විනිමය අනුපාතවලට අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරෙන අතර, වෙළෙඳ නොවන ක්‍රියාකාරකම් නිසා ඇතිවන වෙනස්කම් සියල්ල ලාභාලාභ ප්‍රකාශනයට ඇතුළත් කෙරේ.

ඓතිහාසික පිරිවැයට අනුව ගණනය කරන විදේශ මුදල් ලෙස පවතින මූල්‍යමය නොවන අයිතම මූලික ගනුදෙනුව සිදු වූ දිනයට අදාළ විනිමය අනුපාතවලට අනුව

# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

පරිවර්තනය කෙරේ. සාධාරණ අගයට තක්සේරු කරන මූල්‍ය නොවන අයිතම ලෙස ඇති විදේශීය මුදල් සාධාරන අගය තීරණය කරන අවස්ථාව වන විට ඇති විනිමය අනුපාත අනුව සාධාරණ අගයට පරිවර්තනය කෙරේ.

මූලිකව ප්‍රකාශ කිරීමට වඩා වෙනස් ගෙවීමේදී හෝ මුදල්මය අයිතම දන්වා සිටීමේ දී ඇතිවන විදේශ විනිමය සංකූලතා ලාභාලාභ ප්‍රකාශනයේ සඳහන් කෙරේ.

**2.7.3 ආදායම් හඳුනාගැනීම**

ආර්ථික ප්‍රතිලාභ සමූහ ව්‍යාපාරයට ගලා එන පරිදි ආදායම හඳුනාගෙන ඇති අතර, ගෙවීම සිදුකළ කාලය නොතකා ආදායම නිසි ලෙස ගණනය කළ හැකි වනු ඇත. වෙළෙඳ වට්ටම් හා බදු රහිතව ලත් හෝ ලැබීමට නියමිත මුදලේ සාධාරණ අගයට ආදායම ගණනය කෙරේ.

ආදායම හදුනා ගැනීමට පෙර පහත දැක්වෙන විශේෂිත හදුනාගැනීමේ ක්‍රමවේදය ද අනුගමනය කළ යුතුය.

**(අ) භාණ්ඩ අලෙවිය**

ප්‍රධාන අවදානම් හා භාණ්ඩවල හිමිකාරත්වයේ ප්‍රතිඵල පොදුවේ ගත් කල ගැනුම්කරුට ලැබුණු පසුව භාණ්ඩ අලෙවියේ ආදායම හඳුනා ගැනේ.

**(ආ) සේවා සැපයීම**

සේවා සැපයීමෙන් ලැබෙන ආදායම සේවා ලබාදුන් හෝ සිදුකළ ගිණුම් කාලය තුළ දී හඳුනා ගෙන ඇත.

a) **පොලී ආදායම**

ක්‍රමක්ෂ පිරිවැයට ගණනය කර ඇති මූල්‍ය උපකරණ සියල්ල හා විකිණීමට තබා ඇති ලෙස වර්ග කර ඇති පොලී උපදවන මූල්‍ය වත්කම් සඳහා සක්‍රීය පොලී අනුපාතය (EIR) භාවිත කර පොලී ආදායම හෝ වියදම දක්වා ඇත. සක්‍රීය පොලී අනුපාතය යනු ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ගෙවීම් හෝ මූල්‍ය වත්කමක ආයු කාලය හෝ අදාළ වන පරිදි ඊට අඩු කාල සීමාවක් තුළ මූල්‍ය වත්කමේ හෝ බැරකමේ ශුද්ධ ධාරන අගයට වන ආදායම්වල අනුපාතයයි. පොලී ආදායම ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමෙහි ඇතුළත් කර ඇත.

(b) **ලාභාංශ**

අවසන් කළ ගෙවීමක් සමූහ ව්‍යාපාරයට ලබා ගැනීමට ඇති හිමිකම ආදායම ලෙස හඳුනා ගැනේ.

(c) **වෙනත්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

**2.7.4 බදු පැනවීම**

a) **තථ්‍ය බදු**

වත්මන් හා පූර්ව කාලසීමාවලට අදාළ තථ්‍ය ආදායම් බදු වත්කම් හා බැරකම් අය කර ගැනීමට අපේක්ෂිත මුදලින් හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවීමට ඇති මුදල අනුව තීරණය කෙරේ. මුදල ගණනය කිරීමට යොදාගත් බදු අනුපාත හා බදු නීති වන්නේ බදු සහිත ආදායම් සමාගම උපයන හා මෙහෙයවන දන්වා සිටින දිනට රටේ දැනටමත් පනවා ඇති හෝ පසුව පනවනු ලබන මුදල මත ය. සමකොටස්වල සෘජුව හඳුනාගෙන ඇති අයිතම වලට අදාළ තථ්‍ය ආදායම් බදු ආදායම් ප්‍රකාශනයේ නොව සමකොටස් තුළ හඳුනා ගැනේ.

ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ආදායම් හා වියදම් මූලධාතු මත පදනම් වන අතර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ හා එහි සංශෝධනවල විධිවිධාන අනුව ගණනය කෙරේ.

b) **විලම්බිත බදු**

වත්කම් හා බැරකම් මූල්‍ය අතර දන්වා සිටින දිනයට ඇති තාවකාලික වෙනස්කම් සියල්ල මත බදු පදනම් බැරකම් ක්‍රමය භාවිත කර හා මූල්‍ය කරුණු දැක්වීම් තුළ ඒවායේ ධාරණ අගයන් විලම්බිත ආදායම් බදු දක්වා ඇත.

සියලු බදු අයකළ හැකි තාවකාලික වෙනස්කම් හැර විලම්බිත ආදායම් බදු බැරකම් හඳුනාගෙන ඇත.

i) ව්‍යාපාරික සම්බන්ධයක් නොවන ගනුදෙනුවකට අදාළ වත්කමක් හෝ බැරකමක් මූලික හඳුනාගැනීම මගින් ඇතිවන විලම්බිත ආදායම් බද්ද ගණුදෙනුව සිදු වන අවස්ථාවේ ගිණුම් ලාභයට හෝ බදු පැනවිය හැකි ලාභයට හෝ පාඩුවට බලපෑමක් නොවේ.

ii) උප ආයතන, හවුල්කරුවන් හා ඒකාබද්ධ ව්‍යාපාර කොටස්කරුවන් සමග වන ආයෝජනයන්ට අදාළ බදු පැනවිය හැකි තාවකාලික වෙනස්කම්වලට අදාළව තාවකාලික වෙනස්කම් සමනය කිරීම පාලනය කළ හැකි අවස්ථාවලදී හැර තාවකාලික වෙනස්කම් ප්‍රකාශ කළ හැකි ඉදිරි කාලයක් තුළ නිවැරදි නොවිය හැකිය.





# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්, ගෙන ආ අභාවිත බදු ණයවර හා අභාවිත බදු පාඩු සදහා අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් මත බදුපැනැවිය හැකි ලාභ හා ගෙන ආ අභාවිත බදු ණයවර හා අභාවිත බදු පාඩු පහත අවස්ථා හැර භාවිත කරමින් හැකි මට්ටමට විලම්බිත ආදායම් බදු වත්කම් හඳුනා ගැනේ.

i) ව්‍යාපාරික සම්බන්ධකමක් නොවන ගනුදෙනුවකදී වත්කමක් හෝ බැරකමක් මූලික හදුනා ගැනීමෙන් ඇති වන අඩුකළ හැකි තාවකාලික වෙනස්කමට අදාළ විලම්බිත ආදායම් බදු වත්කම සහ ගනුදෙනුව සිදු වන අවස්ථාවේ ගිණුම් ලාභයට හෝ බදු අයකළ හැකි ලාභයට හෝ පාඩුවට බලපෑමක් නොව අවස්ථාවකදී සහ

ii) උප ආයතන, සහායක සමාගම්වල ආයෝජන සහ ඒකාබද්ධ ව්‍යාපාරවල බැඳියාවන්ට අදාළව අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු වත්කම් තාවකාලික වෙනස්කම් නොපෙනන අනාගතයකට ගලා යන තෙක් හා තාවකාලික වෙනස්කම්වලින් බදු ආදායම් ලබා ගන්නා දුරකට පමණක් හඳුනා ගැනේ.

විලම්බිත ආදායම් බදු වත්කම්වල ධාරන අගය දන්වා සිටින එක් එක් දිනට සමාලෝචනය කර භාවිතා කරන විලම්බිත ආදායම් බදු වත්කම් සියල්ලට හෝ කොටසකට අවස්ථාව ලබා දෙන ප්‍රමාණවත් බදු අයකරන ලාභයක් අත් නොවන තලයකට අඩු කෙරේ.

හඳුනානොගත් විලම්බිත බදු වත්කම් දන්වා සිටින එක් එක් දිනට ප්‍රතිතක්සේරු කරන අතර, අනාගත බදු අයකළ හැකි ලාභ විලම්බිත බදු වත්කම් අය කර ගැනීමට හැකි වන තලයකට හඳුනා ගැනේ.

විලම්බිත ආදායම් බදු වත්කම් හා බැරකම් වත්කම ලබාගත් හෝ බැරකම මුදාහළ, පනවා ඇති හෝ දන්වා සිටින දිනට පනවනු ලබන බදු අනුපාත (සහ බදු නීති) මත වසරට අදාළ විය හැකි බදු අනුපාතවලට ගණනය කෙරේ.

වෙනත් විස්තීරණ ආදායම හෝ සමකොටස් වලට සෘජුවම සම්බන්ධිත පහත දැක්වෙන ගනුදෙනුවකට සම්බන්ධිත අයිතමවලට අදාළව විලම්බිත බද්ද හදුනා ගැනේ.

තථ්‍ය බදු වත්කම් තථ්‍ය බදු බැරකම්වලට බේරුම් කරන නීතිමය බලයක් සහිත සහ විලම්බිත බදු එම බදු අයකළ හැකි දෑ අදාළ වීම හා එම බදු බලධාරියාම වන තත්වය අනුව විලම්බීත බදු වත්කම් හා විලම්බිත බදු බැරකම් හිලවු කෙරේ.

**c) ලාභාංශ ආදායම් බදු පැනවීම**

උප ආයතනවලින් ලැබෙන ලාභාංශ ආදායමට පනවන බද්ද ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

**2.7.5 දේපල, පිරියත හා උපකරණ**

දේපල, පිරියත හා උපකරණ යනු නිෂ්පාදනයේදී හෝ සේවා සැපයීමට භාවිත කිරීමට ගන්නා වෙනත් පුද්ගලයන්ට කුලියට ලබා දෙන හෝ පරිපාලන කටයුතු වලට යොදා ගන්නා, එක් අවස්ථාවකට වඩා වැඩි වාර ගණනක් භාවිතා කිරීමට අපේක්ෂා කරන නියත අයිතමයන්ය. ශ්‍රී ලංකාවේ අවශ්‍යතා සමූහ ව්‍යාපාරය අනුගමනය කරයි.

මෙම වත්කම් ගණනය කිරීමේ ගිණුම් ගිණුම් ප්‍රමිතිය - LKAS 16 (දේපල, පිරියත හා උපකරණ)

**2.7.6 පිළිගැනීම**

වත්කම හා සම්බන්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහ ව්‍යාපාරයට ගලාඒම හා වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කිරීම මත දේපල, පිරියත හා උපකරණ හඳුනා ගැනේ.

**2.7.7 ගණනය කිරීම**

වත්කමක් ලෙස හදුනා ගැනීමට සුදුසු වන දේපල, පිරියත හා උපකරණයක් ඒවායේ පිරිවැයට මූලිකව ගණනය කෙරේ. පිරිවැය තුළ වත්කම අත්පත් කර ගැනීමට සෘජුව හේතු වූ වියදම හා එකී දේපල, පිරියත හා උපකරණය පසුකාලීනව එකතු කිරීමට, විස්ථාපනය කිරීමට අදාළ පිරිවැය ඇතුළත් වේ. ස්වයං නිර්මාණිත වත්කම වල පිරිවැය තුළ අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රම පිරිවැය හා වත්කම මගින් අපේක්ෂිත ප්‍රයෝජනය සදහා එය ක්‍රියාකාරී තලයට ගෙන ඒමට කළ වෙනත් වියදම්, අයිතම අක්‍රිය කිරීමට හෝ ඉවත් කිරීමේ සහ ඒවා පිහිටි ස්ථානවල පිහිටුවීමේ වියදම් ඇතුළත් වේ. අදාළ උපකරණයේ ක්‍රියාකාරිත්වයට අත්‍යාවශ්‍ය වන මිලදීගත් මෘදුකාංග පරිගණක උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

දේපලක හෝ උපකරණයක කොටස්වල වෙනස් වූ භාවිත ආයුකාල ඇති අවස්ථාවක දේපල, පිරියත හා උපකරණ වල වෙනස් අයිතම (ප්‍රධාන අංග) ලෙස ගිණුම්ගත කෙරේ.

# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

### 2.7.8 පිරිවැය මාදිලිය

සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි හැර දේපල, පිරියත හා උපකරණ සඳහා සමූහ ව්‍යාපාරය පිරිවැය මාදිලිය යොදා ගැනෙන අතර, සමුච්ජිත ක්ෂය හා සමුච්ජිත අපවයවීමේ පාඩු නොතකා අදාළ වියදම් සමග මිලදී ගැනීමේ හෝ ඉදිකරීම් පිරිවැයට දක්වනු ලබයි.

### 2.7.9 ප්‍රත්‍යාගණන මාදිලිය

සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි සමස්තය සදහාම සමූහ ව්‍යාපාරය ප්‍රත්‍යාගණන මාදිලිය යොදා ගැනේ. එවැනි දේපල ඒවා ප්‍රත්‍යාගණනය කළ දිනට සමුච්ජිත ක්ෂය හා සමුච්ජිත අපවයවීමේ පාඩු නොතකා අදාළ සාධාරණ අගයට ප්‍රතිඇගයුම් වටිනාකමට දැක්වේ. සමූහ ව්‍යාපාරයේ  සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි දක්වා සිටින දිනට ධාරන අගයන්වලින් ද්‍රව්‍යාත්මකව වෙනස් නොවන ලෙස  සෑම වසර තුනකට වතාවක් ප්‍රතිඇගයුම් කෙරේ. වත්කමක් ප්‍රතිඇගයුම් කිරීමේදී, ධාරන අගයේ වෙනස්වීම් "වෙනත් විස්තීරණ ආදායම" තුළ හඳුනා ගන්නා අතර ලාභාලාභ ප්‍රකාශනයේ දක්වා ඇති එම වත්කමට අදාළ පූර්ව ප්‍රතිඇගයුම් අඩුවීම සැකසීමට හෝ ප්‍රග්ධන සංචිතය යටතේ සමකොටස් උපචිත මෙම තත්වය යටතේ, පූර්ව සටහන් කිරිමේ ප්‍රමාණයට වැඩිවීම ආදායමක් ලෙස හඳුනා ගැනේ.

ධාරන අගයේ කිසියම් අඩුවීමක් වී ඇත්නම් එය ලාභාලාභ ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගැනීම හෝ එකී වත්කමට අදාළ ප්‍රාග්ධන සංචිතයේ ඇති ණය ශේෂය ප්‍රමාණය අනුව වෙනත් විස්තීරණ ආදායම තුළ හර කෙරේ. වෙනත් විස්තීරණ ආදායම තුළ අඩුවිම හඳුනා ගැනීම මගින් ප්‍රාග්ධන සංචිත යටතේ සමකොටස්වලට උපචිත වූ මුදල අඩු කෙරේ. වත්කමට අදාළව ප්‍රතිඇග යුම් සංචිතයක පවතින ශේෂ වත්කම ඉවත් කිරීමේ දී ඇති රැඳවුම් ඉපයීම් වෙත සෘජුව මාරු කෙරේ.

### 2.7.10 පශ්චාත් පිරිවැය

දේපලක, පිරියතක හා උපකරණයක අංගයක් ප්‍රතිස්ථාපනය කිරීමේ පසුකාලීන පිරිවැය එහි ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහ ව්‍යාපාරයට අත්වීමේ හැකියාව මත හා එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනීම මත එම අයිතමයේ ධාරන අගයට හඳුනා ගැනේ. දේපල, පිරියත හා උපකරණ එදිනෙදා සේවා කටයුතු වල පිරිවැය ලාභාලාභ ප්‍රකාශනයේ සිදුවන අවස්ථාවල ඇතුළත් කෙරේ.

### 2.7.11 නොපිළිගැනීම

දේපලක, පිරියතක හා උපකරණයක ධාරන අගය ඉවත් කිරීම මත හෝ ඉන් බලාපොරොත්තු වූ අනාගත ආර්ථික ප්‍රතිලාභ නොලැබීම මත ප්‍රතික්ෂේප කෙරේ. දේපලක, පිරියතක හා උපකරණය නොපිළිගැනීම නිසා ඇති වන වාසිය හෝ පාඩුව එකී අයිතමය පිළිනොගැනීම සිදුවන විට ලාබාලාභ ප්‍රකාශනයේ ඇතුළත් කර ඇත.

දේපලක, පිරියතක හා උපකරණයක ධාරන අගයේ ප්‍රතිස්ථාපන පිරිවැය හදුනා ගැනීමේ දී ප්‍රතිස්ථාපිත කොටසේ ඉතිරි ධාරන අගය නොපිළිගැනේ. ප්‍රධාන පිරික්සුම් පිරිවැය ප්‍රාග්ධනිත කෙරේ. එවැනි එක් එක් ප්‍රාග්ධනිත කිරීමේ දී, පිරික්සුම්වල පූර්ව පිරිවැයවල ඉතිරි ධාරන අගය නොපිළිගැනේ.

### 2.7.12 ක්ෂයවීම්

වත්කම භාවිතාවට ගත් දිනයේ සිට ඉවත් කරන දිනය වනතෙක් වූ ක්ෂයවීම් සදහා සමූහ ව්‍යාපාරය විසින් ලබා ගැනීමට බලාපොරොත්තුවන වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභවල ආකාරය මත පදනම් වූ ඇස්තමේන්තුගත ආයුකාල වලට ගැලපෙන ලෙස සෘජු රේඛීය පදනම මත පහත දැක්වෙන අනුපාතවලට සමූහ ව්‍යාපාරය ප්‍රතිපාදන සලසයි. ඉඩම් සඳහා ක්ෂයවීම් අදාළ නොවේ.

අලෙවිය සදහා තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති දිනට හෝ වත්කම නොපිළිගන්නා දිනය උදාවීමත් සමග වන විට වත්කමක ක්ෂයවීම් නියමිත කලට පෙර අවසන් වේ. වත්කම පූර්ණව ක්ෂය නොවන්නේනම් වත්කම අක්‍රීය වන විට හෝ සක්‍රීය භාවිතාවෙන් තොර වන විට ක්ෂයවීම අඛණ්ඩව සිදු වේ.

සමූහ ව්‍යාපාරය විසින් භාවිත කරන ප්‍රධාන වාර්ෂික ක්ෂය අනුපාත පහත දක්වා ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2.5% |
| **යටිතල පහසුකම් සැපයීම** | |
| උපපොලවල්, උඩු රැහැන් ) | |
| පළාත්පාලන ආයතන හා | |
| ලංවිම ලබාගෙන ඇති සේවා රැහැන් | 10% |
| උපපොලවල්, උඩු රැහැන් ) | |
| ලෙකෝ ඉදිකළ සේවා රැහැන් | 4% - 5% |
| රථවාහන | 15% -20% |
| පරිගණක | 20% - 33 1/3% |
| කාර්යාලයී උපකරණ | 15%-33 1/3% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 25% - 33 1/3% |





# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

### 2.7.13 කල්බදු

සැකසුමක් තිබීම හෝ ඇතුළත් කිරීම අවශ්‍ය වන්නේ දැයි තීරණය කිරිම සැකසුම ආරම්භක දිනයේ තත්වය මත කල්බදු තීරණය වේ. විශේෂිත වත්කම හෝ වත්කම් හෝ වත්කම හෝ සැකැස්මක විශේෂිතව සඳහන් නොවන හිමිකමක් ඇති වුවද වත්කම් භාවිත කිරීමට හිමිකමක් පළකරන සැකැස්ම අනුව සැකසුම තක්සේරු කෙරේ.

#### මෙහෙයුම් කල්බදු

මෙහෙයුම් කල් බදු ගෙවීම් ආදායම් ප්‍රකාශනයේ මෙහෙයුම් වියදමක් ලෙස බදු කාලය පුරා සෘජු රේඛීය පදනම මත හඳුනා ගෙන ඇත.

### 2.7.14 ණයගැනීමේ පිරිවැය

අත්පත් කර ගැනීම්, අපේක්ෂිත ප්‍රයෝජනය හෝ විකිණීම සඳහා සැලකිය යුතු කාලයක් ගත යුතු වත්කමක් ඉදිකිරීම හෝ නිපදවීමවලට සෘජුව අදාළව ණයගැනීමේ පිරිවැය අදාළ වත්කම්වල පිරිවැයේ කොටස් ලෙස ප්‍රාග්ධනිත කෙරේ.

වෙනත්  ණයගැනීමේ පිරිවැය සියල්ල ඒවා සිදුවන කාලසමයේදී වියදම් කෙරේ. අරමුදල් ණයට ගැනීමට අදාළව ආයතනයක් සිදු කරන පොලියෙන් හා වෙනත් පිරිවැයවලින් ණයගැනීමේ පිරිවැය සමන්විත වේ.

### 2.7.15 අප්පෘෂ්ඨ වත්කම්

අප්පෘෂ්ඨ වත්කමක් යනු හඳුනාගත හැකි, භාණ්ඩ නිෂ්පාදනයේ හෝ සේවා සැපයීමේදි භාවිතාව සදහා භෞතික හරයක් නොමැති අන් අය සඳහා හෝ පරිපාලන කටයුතුවලට කුලියට ලබා දෙන මූල්‍යමය නොවන වත්කමකි.

වෙන් වශයෙන් ලබාගත් අප්පෘෂ්ඨ වත්කම් පිරිවැයේ මුලික හදුනා ගැනීමට ගණනය කෙරේ. ව්‍යාපාරික කටයුත්තකින් ලබා ගන්නා අප්පෘෂ්ඨ වත්කම් වල පිරිවැය අත්පත් කර ගත් දිනට ඒවායේ ඇති සාධාරණ වටිනාකමට ගණනය කෙරේ.

පහත දැක්වෙන මූලික හඳුනාගැනීම, අප්පෘෂ්ඨ වත්කම් පිරිවැය අඩුකළ එකතුවූ ක්‍රමක්ෂය හා එකතු වූ අපවයවීම් ඇතොත් ඒවා අනුවද ඉදිරිපත් කර ඇත. ප්‍රාග්ධනිත සංවර්ධන පිරිවැය හැර අභ්‍යන්තරිකව උපයාගත් අප්පෘෂ්ඨ වත්කම් ප්‍රාග්ධනිත කර නොමැති අතර, වියදම සිදුකළ වසරේ ආදායම් ප්‍රකාශනය තුළ වියදම දක්වා ඇත.

අප්පෘෂ්ඨ වත්කම්         වල භාවිත ආයුකාල ස්ථිර හෝ අස්ථිර ලෙස තක්සේරු කෙරේ.

ස්ථිර ආයුකාලයක් සහිත අප්පෘෂ්ඨ වත්කම් ඒවායේ භාවිත ආර්ථික කාලසීමාවට ක්‍රමක්ෂය කර අප්පෘෂ්ඨ වත්කම අපවය වන බවට ලක්ෂණ පෙන්නුම් කිරීමේදී අපවයවීම් තක්සේරු කෙරේ.  ස්ථිර ප්‍රයෝජනවත් ආයුකාලයක් ඇති අප්පෘෂ්ඨ වත්කමක ක්‍රමක්ෂ කාලසීමාව හා ක්‍රමක්ෂ ක්‍රමය එක් එක් දන්වා සිටින දින අවසානයේ අවම වශයෙන් විමර්ශනයට ලක් කෙරේ.

අපේක්ෂිත භාවිත ආයුකාලය හෝ වත්කම තුළ ඇතුළත් අනාගත ආර්ථික ප්‍රතිලාභ වල අපේක්ෂිත පාරිභෝජ්‍ය ආකාරයේ වෙනස්කම්  ක්‍රමක්ෂය කාලය හෝ ක්‍රමය සුදුසු ලෙස වෙනසකට ලක් කර හා ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්කම් ලෙස සලකා ගිණුම් ගත කෙරේ. ස්ථිර ආයුකාලයක් සහිත අප්පෘෂ්ඨ වත්කම් වල ක්‍රමක්ෂය වියදම අප්පෘෂ්ඨ වත්කමේ ක්‍රියාකාරිත්වය සමග ගැලපෙන වියදම් රටාවකින් ආදායම් ප්‍රකාශනය තුළ පිළිගැනේ.

අස්ථිර භාවිත ආයුකාලයක් ඇති අප්පෘෂ්ඨ වත්කම් ක්‍රමක්ෂය නොකළද පළුදුවීම් පෞද්ගලිකව හෝ මුදල් උපයන ඒකක මට්ටමින්  වාර්ෂිකව පරීක්ෂා කෙරේ. අස්ථිර ආයුකාලය දිගින් දිගටම හිතකර දැයි තීරණය කර ගැනීම සදහා අස්ථිර ආයුකාලය තක්සේරු කිරීම වාර්ෂිකව සිදු කෙරේ. එසේ නොවන අවස්ථාවකදී, අස්ථිර තත්වයේ සිට ස්ථිර තත්වය තෙක් භාවිත ආයුකාලයේ වෙනස අනාගත පදනම මත සැකසේ.

අප්පෘෂ්ඨ වත්කමක් නොපිළිගැනීම නිසා ඇති වන වාසි හෝ අවාසි ශුද්ධ ඉවත් කිරීමේ මුදල හා වත්කමේ ධාරන අගය අතර වෙනස ලෙස ගණනය කෙරෙන අතර වත්කම නොපිළිගන්නා අවස්ථාවේදී ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

### 2.7.16 තොග

පිරිවැයට අඩුවෙන් හා ශුද්ධ උපලබ්ධිවිය හැකි අගයට තොග තක්සේරු කර ඇත.

එක් එක් භාණ්ඩය එහි වත්මන් තත්වයට හා ස්ථානයට ගෙන පත් කිරීමට කළ පිරිවැය පහත පරිදි ගිණුම්වල දක්වා ඇත.

0 බරතැබූ සාමාන්‍ය පදනම මත මෙහෙයුම් හා නඩත්තු භාණ්ඩ.

0 මාර්ගස්ථ භාණ්ඩ හා වෙනත් තොග පවත්නා පිරිවැයට

ශුද්ධ උපලබ්ධිවිය හැකි වටිනාකම යනු ඇස්තමේන්තුගත නිමැවුම් පිරිවැය හා ඇස්තමේන්තුගත විකුණුම් පිරිවැය අඩුකළ ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවල ඇස්තමේන්තු කළ විකුණුම් මිලයි.

# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

**2.7.17 මූල්‍ය උපකරණ - මූලික පිළිගැනුම හා පසුකාලීන ඇගයීම**

**i) මූල්‍ය වත්කම්**

**මූලික පිළිගැනීම් හා ඇගයීම**

LKAS 39 විෂය පථයට ඇතුළත් මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ, ණය හා ලැබීමට නියමිත දෑ, කල්පිරීමට තබා ඇති ආයෝජන හා අලෙවි මූල්‍ය වත්කම් ලෙස තබා ඇති සාධාරණ අගයට මූල්‍ය වත්කම් ලෙස වර්ග කරන අතර, ඒවායේ ආරම්භක හඳුනා ගැනීමේ දී මූල්‍ය වත්කම් සුදුසු ලෙස වර්ග කෙරේ.

මූල්‍ය වත්කම් සියල්ල සාධාරණ වටිනාකම් එකතුවට මූලිකව හඳුනා ගැනෙන අතර ආයෝජන වලදී ගනුදෙනු පිරිවැයට සෘජුව අදාළ වන ලාභ හෝ අලාභ මගින් සාධාරණ වටිනාකම මත එය එසේ නොවේ.

මූල්‍ය වත්කම් ලෙස මුදල් හා කෙටිකාලීන තැන්පත්, වෙළෙඳ හා වෙනත් ලැබීමට නියමිත දෑ හා වෙනත් මූල්‍ය වත්කම් ඇතුළත් වේ.

**පශ්චාත් ගණනය කිරීම**

මූල්‍ය වත්කම් පශ්චාත් ගණනය පහත දැක්වෙන ඒවායේ වර්ගීකරණය මත තීරණය වේ.

**ණය හා අය විය යුතු දෑ**

ණය හා ලැබීමට නියමිත දෑ යනු සක්‍රිය වෙළෙඳපොළේ මිලගණන් දක්වා නොමැති ස්ථාවර හෝ තාවකාලික ගෙවීම්වලින් සමන්විත ව්‍යුත්පන්න විය හැකි මූල්‍ය වත්කම්ය. එවැනි මූල්‍ය වත්කම් මූලික ගණනය කිරීමෙන් අනතුරුව, අපවයවීම් ඉවත් කර පවත්නා පොලී අනුපාත ක්‍රමය (EIR) භාවිත කර ක්‍රමක්ෂය කළ පිරිවැයට ගණනය කෙරේ. අත්පත් කර ගැනීමේදී ලැබෙන කිසියම් හෝ වට්ටම හෝ වාරිකය හා පවත්නා පොලී අනුපාත ක්‍රමයේ අත්‍යවශ්‍ය කොටසක් වන පිරිවැය සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කෙරේ.

පවත්නා පොලී අනුපාත ක්‍රමයේ ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම තුළ ඇතුළත් කෙරේ. අපවයවීමෙන් ඇති වන පාඩු ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

**අලෙවිය සදහා ඇති මූල්‍ය ආයෝජන**

අලෙවිය සදහා ඇති මූල්‍ය ආයෝජන තුළ සමකොටස් හා ණය සුරුකුම් අන්තර්ගත වේ. අලෙවිය සඳහා ලෙස වර්ගකර ඇති සමකොටස් ආයෝජන යනු අලෙවිය සඳහා රඳවාගෙන නොමැති හා ලාභ හෝ අලාභ මගින් සාධාරණ වටිනාකම තිරණය කර නොමැති ලෙන වර්ග කළ ඒවා වේ. මෙම වර්ගයට අයත් ණය සුරැකුම් යනු අවිනිශ්චිත කාලසීමාවක් දක්වා රඳවා ගැනීමට බලාපොරොත්තු වන හා ද්‍රව්‍යාත්මක ප්‍රමාදයට ද්‍රවශිලීතාවට විකිණිය හැකි හෝ වෙළඳපොළ තත්වයන් වෙනස්වීම මත තීරණය වන ඒවාය.

මූලික ගණනය කිරීමෙන් අනතුරුව, ආයෝජනය හදුනානොගන්නා සංචිත විකිණීම සඳහා ඇති අලෙවිය සදහා ඇති මූල්‍ය ආයෝජන වෙනත් විස්තීරණ ආදායමක් ලෙස හදුනාගත් විකිණීමෙන් වූ වාසි හෝ පාඩු සමග ඒවායේ සාධාරණ වටිනාකමට පසුකාලීනව ගණනය කෙරේ. මෙහිදී සමුච්ඡිත වාසිය හෝ පාඩුව වෙනත් මෙහෙයුම් ආදායමක් එසේ නොමැතිනම් සමුච්ඡිත පාඩුව ආදායම් ප්‍රකාශනයේ ප්‍රතිවර්ගීකරණය කළ සහ විකිණීම සදහා ඇති සංචිතයෙන් ඉවත්කළ අපවයවූ ලෙස තීරණය කළ ලෙස හඳුනා ගැනේ. විකිණීම සදහා වූ ණය සුරැකුම්පත්වල පොලී ආදායම සක්‍රීය පොලී ක්‍රමය යොදා ගණනය කර ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගැනේ.

අලෙවිය සදහා ඇති මූල්‍ය වත්කම් නුදුරු කලකින් සුදුසු ලෙස විකුණා දැමීමට ඇති හැකියාව හා අභිප්‍රාය තීරණය කිරීම සඳහා සමූහ ව්‍යාපාරය විසින් වටිනාකම් නිශ්චය කෙරේ. අක්‍රිය වෙළෙඳපොළ නිසා හා නිශ්චිත ඉදිරි කාලයකදි ප්‍රධාන වෙනස්කම් කිරීමට කළමනාකාරීත්වය තීරණය කිරීමේදී සමූහ ව්‍යාපාරයට මෙම මූල්‍ය වත්කම් විකිණීමට නොහැකිවූ අවස්ථාවක සමූහ ව්‍යාපාරය මෙම මූල්‍ය වත්කම් වෙනත් ක්‍රම මගින් ප්‍රතිවර්ගීකරණය කිරීමට උත්සාහ කෙරේ. ණය හා ලැබීමට නියමිත දෑ ප්‍රතිවර්ගීකරණය සඳහා ණය හා ලැබීමට නියමිත දෑ අතර අර්ථදැක්වීම මූල්‍ය වත්කමට ඇති විට සහ මෙම වත්කම් අනාගත කාලසීමාවකට රදවා ගැනීමට සමූහ ව්‍යාපාරයට ඇති බලාපොරොත්තුව හා හැකියාව මත හෝ ඒවායේ කල්පිරීම මත අවස්ථාව සැලසේ. කල්පිරීම සඳහා වූ වර්ගයේ ප්‍රතිවර්ගීකරණය සදහා ඉඩ සැලසේ. ආයතනයට ඇති හැකියාව හා මූල්‍ය වත්කම තබා ගැනීමට ඇති අභිලාෂය අනුව කල්පිරීමේ වර්ගය ප්‍රතිවර්ගීකරණය සදහා අවස්ථාව සැලසේ.

අලෙවිය සදහා තබා ඇති වර්ගයෙන් බැහැරව ඇති මූල්‍ය වත්කමක් සදහා සමකොටස්වල හදුනාගෙන ඇති වත්කමක පූර්ව වාසිය හෝ පාඩුව මත EIR භාවිත කරමින් ආයෝජනයේ ඉතිරි කාලසීමාවට ලාභ හෝ පාඩු අනුව ක්‍රමක්ෂය කෙරේ. නව ක්‍රමක්ෂිත පිරිවැය හා අපේක්ෂිත මුදල් ගලන අතර වෙනසක් ඇතොත් ඒවාද EIR යොදා වත්කමේ ඉතිරි කාලසීමාවට ක්‍රමක්ෂය කෙරේ. වත්කම අපවයවී ඇති බවට පසුකාලීනව තීරණය වූ අවස්ථාවකදී සමකොටස්වල සඳහන් කර ඇති මුදල ආදායම් ප්‍රකාශනයේ ප්‍රතිවර්ගීකරණය කෙරේ.





**නොපිළිගැනීම**

මූල්‍ය වත්කමක් (එසේ නැතහොත්, අදාළ වන පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කමක් සමූහයක් කොටසක්) පහත තත්වයන් මත නොපිළිගැනේ.

i) වත්කමෙන් මුදල් ගලන ලබා ගැනීමේ හිමිකම් කල්ඉකුත් වී ඇති අවස්ථාවක

ii) වත්කමකින් මුදල් ගලන ලබා ගැනීම සදහා හෝ ද්‍රව්‍යාත්මක ප්‍රමාදයකින් තොරව විනිවිද ක්‍රමයක් යටතේ තෙවන පාර්ශ්වයකට සමූහ ව්‍යාපාරයකට මුදල් ගලන ලබා ගැනීමට හැකි වන ලෙස තම හිමිකම් පවරා ඇති අවස්ථාවක යන අවස්ථා දෙකෙන් එකක්.

0 වත්කමක සියලු අවශේෂී අවදානම් හෝ පාරිතෝෂිත සමූහ ව්‍යාපාරය විසින් පවරා ඇති අවස්ථාවක, හෝ

0 වත්කමක අවශේෂී අවදානම් හෝ පාරිතෝෂිත සියල්ල සමූහ ව්‍යාපාරය විසින් පවරා හෝ රඳවා ගෙන නොමැති වුවද වත්කමෙහි පාලනය පවරා ඇති අවස්ථාවක.

වත්කමකින් මුදල් ගලන ලබාගැනීමේ හිමිකම් සමූහ ව්‍යාපාරය පවරන හෝ තාවකාලික ක්‍රමවේදයක් අනුගමනය කරන අවස්ථාවකදී වත්කමේ අවදානම් හා ප්‍රතිවිපාක සියල්ල මාරු කර නොමැති හා කිසියම් ලෙසක රඳවා ගෙන නොමැති අවස්ථාවක ඒ සදහා සමාගම අඛණ්ඩව සබඳතාවක් ඇති ලෙස එම වත්කම හදුනා ගැනේ.

එම තත්වය තුල, සමූහ ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස හදුනා ගැනේ. මාරුකල වත්කම් හා හවුල් බැරකම් සමූහ ව්‍යාපාරය රදවාගත් හිමිකම් හා බැදීම් විදහා දක්වන පදනමකට අනුව ගණනය කෙරේ.

මාරුකළ වත්කමක අගය ගණනය කරනුයේ වත්කමේ සැබෑ ධාරන අගයට අඩුවෙන් හා සමූහ ව්‍යාපාරයට ආපසු ගෙවිය යුතු මුළු වටිනාකමේ උපරිම මුදලටය.

**ii) මූල්‍ය වත්කම් අපවයවීම**

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් තොගයක් අපවයවී ඇති බවට කිසියම් විෂයමූලික සාක්ෂ්‍ය එක් එක් දන්වා සිටින දිනට ඇත් දැයි සමූහ ව්‍යාපාරය සැලකිලිමත් වේ. වත්කම මූලික හදුනා ගැනීමෙන් අනතුරුව සිදුවන සිදුවීම් එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් තොගයක් අපවයවී ඇති බවට විෂය මූලික සාක්ෂ්‍ය ඇති හා සමූහ ව්‍යාපාරයේ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කමක අනාගත මුදල් ගලන වලට බලපෑමක් වන අවස්ථාවක ඒවා විශ්වාසදායී ලෙස ඇස්තමේන්තු ගත කෙරේ.

අපවයවීමේ සාක්ෂ්‍ය ලෙස ණයගැතියන් හෝ ණයගැති පිරිසක් ප්‍රධාන ගෙවීම් හෝ පොලී ගෙවීමට නොහැකි සැලකිය යුතු මූල්‍ය අර්බුදයක, ගෙවීම් පැහැර හැරීමක හෝ යුතුකම් පැහැරහැරීමක ලක්ෂණ සඳහන් කළ හැකි අතර, එහිදී ඔවුන් බංකොලොත්බවට පත්වීමට හෝ වෙනත් මූල්‍ය සැකසුමකට එක්වීමේ හැකියාව දක්වමින් හිඟ මුදල් වල හෝ ගෙවීම් පැහැර හැරීමට තුඩු දෙන ආර්ථික තත්වයන්ගේ වෙනස්කම් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලනවල සැලකිය යුතු අඩුවීමක් ඇති බවට පැහැදිලි දත්ත මගින් පෙන්නුම් කළ හැකිය.

**ක්‍රමක්ෂයකළ පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂිත පිරිවැයට දක්වා ඇති මූල්‍ය වත්කම්වලට අදාළව, මූල්‍ය වත්කම්වල සෘජුව අදාළවන හෝ පොදුවේ බලපාන අපවයවීමක් ඇති බවට විෂයමූලික සාක්ෂ්‍ය තිබේදැයි සමූහ ව්‍යාපාරය පළමුව සොයා බැලේ. වැදගත් හෝ වැදගත් නොවන පෞද්ගලිකව තක්සේරුකළ මූල්‍ය වත්කමක අපවයවිමක් තිබෙන බවට කිසිදු විෂයමූලික සාක්ෂ්‍යයක් නොමැති බව සමූහ ව්‍යාපාරය තීරණය කරන්නේනම් ඒවා සමාන අවදානම් ලක්ෂණ ඇති මූල්‍ය වත්කම් කාණ්ඩයට ඇතුළත් කර ඒවා අපවය කිරීම සදහා පොදුවේ තක්සේරු කෙරේ. අපවයවීම සඳහා පෞද්ගලිකව තක්සේරුකළ අපවය පාඩුවකට ලක් වි ඇති එසේ නැතිනම් අඛණ්ඩව එසේ සිදුවන බවට හඳුනාගෙන ඇති වත්කම් අපවයවීමේ ඒකාබද්ධ තක්සේරුවට ඇතුළත් නොවේ.

අපවය පාඩුවක් සිදුවී ඇති බවට විෂයමූලික සාක්ෂ්‍ය ඇති අවස්ථාවකදී, පාඩු මුදල වත්කමේ ධාරන වටිනාකම හා ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලනවල (මෙතෙක් සිදු නොවූ අනාගත අපේක්ෂිත ණය පාඩු හැර) වටිනාකම් අතර වෙනස ලෙස ගණනය කෙරේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලන වලට තථ්‍ය වටිනාකම මූල්‍ය වත්කමේ සැබෑවට පවත්නා පොලි අනුපාතයට වට්ටම් කෙරේ. ණය මුදල තුළ විචල්‍ය පොලී අනුපාත ඇති අවස්ථාවකදී, කිසියම් අපවයවීමේ පාඩුවක් ගණනය කිරීමේ වට්ටම් අනුපාතය යනු තථ්‍යය බලපවත්නා පොලී අනුපාතයයි.

වන්දි ගිණුමක් භාවිත කිරීම මගින් වත්කමක ධාරන අගය අඩු කර පාඩු වූ මුදල ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ. පොලී ආදායම අඩුකළ ධාරන අගය මත අඛණ්ඩව සිදු වන අතර, එය අපවය පාඩු ගණනය කිරීම සදහා අනාගත මුදල් ගලන වට්ටම් කිරීමට භාවිත කළ පොලී අනුපාත භාවිත කර උපචය කෙරේ. පොලී ආදායම ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමේ කොටසක් ලෙස දක්වා ඇත. ණය හා ඒ සම්බන්ධිත දීමනා අනාගත අයකර ගැනීමේ කිසිදු හැකියාවක් නොමැතිවීම තුළ කපා හැරෙන අතර සමාන්තරයන් සියල්ල අය කර ගැනීමටත් එසේ නැතහොත් සමූහ ව්‍යාපාරය පැවරීම සිදු වේ. පසුකාලීන වසරකදී අපවයවීම හදුනා ගැනීමෙන් අනතුරුව ඇති වු සිදුවීමකින් ඇස්තමේන්තුගත අපවය වීමේ පාඩුව අඩුවීම හෝ වැඩිවීම සිදු වන අවස්ථාවක, කලින් හදුනාගත් අපවය පාඩුව දීමනා ගිණුම ගැලපුම් කර අඩු හෝ වැඩි කෙරේ. අනාගත ලියාහැරීමක් පසුව ලැබූ අවස්ථාවකදී එසේ ලත් මුදල ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැයට බැර කෙරේ.

# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

**මූල්‍ය ආයෝජන අලෙවිය සඳහා කටයුතු කිරීම**

අලෙවිය සඳහා වූ මූල්‍ය ආයෝජනවලට අදාළව ආයෝජනයක හෝ සමූහ ව්‍යාපාරයේ ආයෝජන අපවය වී ඇති බවට විෂයමූලික සාක්ෂ්‍ය තිබේදැයි සමාගම එක් එක් දන්වා සිටින දිනට තක්සේරුවකට ලක් කෙරේ.

අලෙවිය තබා ඇති ලෙස වර්ග කර ඇති සමකොටස් ආයෝජන වලදී, පිරිවැය වඩා අඩු ආයෝජනවල සාධාරණ වටිනාකමෙහි ප්‍රධාන හෝ කාලයක් ගතවන අඩුවීම තුළ විෂයානුබද්ධ සාක්ෂ්‍ය වල අන්තර්ගත වේ. අපවයවීමක් සිදුවී ඇති අවස්ථාවකදී, මිලදී ගැනීමේ පිරිවැය හා තථ්‍ය සාධාරණ වටිනාකම අතර වෙනස ලෙස සමුච්ඡිත පාඩුව ගණනය කර වෙනත් විස්තීරණ ආදායමින් ඉවත් කර ආදායම් ප්‍රකාශනයේ සඳහන් කෙරේ.

සමකොටස් ආයෝජනවල අපවයවීමේ පාඩු ආදායම් ප්‍රකාශනය තුළින් අවලංගු කර නොමැත. අපවයවීම්වලින් පසු සාධාරණ වටිනාකම් වැඩිවීම වෙනත් විස්තීරණ ආදායම තුළ සෘජුව හඳුනා ගෙන ඇත.

විකිණීම සදහා ලෙස වර්ග කර ඇති ණය උපකරණ අවස්ථාවකදී, අපවයවීම ක්‍රමක්ෂිත පිරිවැයට සැකසූ මූල්‍ය වත්කම් ලෙස එම ක්‍රමවේදයටම අනුව තක්සේරු කර ඇත. කෙසේ වුවද, අපවයවීම සදහා වන මුදල යනු ආදායම් ප්‍රකාශනයේ පෙර හදුනාගත් එම ආයෝජනයේ අපවය වූ පාඩු අඩුකර ක්‍රමක්ෂිත පිරිවැය හා තථ්‍ය සාධාරණ වටිනාකම අතර වෙනස ලෙස ගණනය කළ සමුච්ඡිත පාඩුවයි.

අනාගත පොලී ආදායම වත්කමේ අඩුකළ ධාරන අගයේ මත අපවය වීමේ පාඩුව ගණනය කිරීම සදහා අනාගත මුදල ගලන වට්ටම් කිරීමට භාවිත කරන පොලී අනුපාත වලට අනුව අඛණ්ඩව ලැබේ. මුදල් ආදායම් වල කොටසක් ලෙස පොලි ආදායම දක්වා ඇත. පසුව එළැඹෙන වසරකදී ණය උපකරනයක සාධාරන වටිනාකම වැඩිවීමක් වුවහොත් එම වැඩිවිම ආදායම් ප්‍රකාශනයේ හදුනාගන්නා අපවය පාඩු වලට පසුව සිදුවන සිදුවිමකට අදාළ විය හැකි අතර ආදායම් ප්‍රකාශනය මගින් අපවයවීමේ පාඩුව නිවැරදි කෙරේ.

**මූල්‍ය බැරකම්**

**මූලික පිළිගැනීම හා මැණීම**

LKAS 39 විෂය පථයට අයත් මූල්‍ය බැරකම් ලාභ හෝ අලාභ, ණය හා ණයට ගැනීම්, වෙනත් මූල්‍ය බැරකම් හෝ අදාළ වන පරිදි හෙජිං ක්‍රම ලෙස නම් කර ඇති ව්‍යුත්පන්න ආකාරයෙන් සාධාරණ වටිනාකමට බැරකම් ලෙස වර්ගීකරණය කර ඇත. තම මූල්‍ය බැරකම් මූලික හදුනාගැනීමට වර්ගීකරණය කිරීම සමූහ ව්‍යාපාරය විසින් තීරණය කෙරේ.

මූල්‍ය බැරකම් සියල්ල සාධාරණ අගයට මූලිකව හඳුනා ගැනෙන අතර ණය හා ඉල්ලාගත් දෑ හා වෙනත් මූල්‍ය බැරකම් ක්‍රමක්ෂය කළ පිරිවැය දක්වා ඇත. මෙයට ගනුදෙනු පිරිවැයට සෘජුව අදාළ වේ.

දක්වා සිටින දිනට සමූහ ව්‍යාපාරයේ මූල්‍ය බැරකම් තුළ වෙළෙඳ හා වෙනත් ගෙවීමට ඇති දෑ සහ බැංකු අයිරා අඩංගු වේ.

**පශ්චාත් ගණනය**

මූල්‍ය බැරකම් තක්සේරුව පහත දැක්වෙන ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

**ණය හා ණයගැනීම්**

මූලික හදුනාගැනීමෙන් අනතුරුව, පොලී ගෙවිය යුතු ණය හා ඉල්ලා ගැනීම් සක්‍රීය පොලී අනුපාත ක්‍රමය භාවිත කර ක්‍රමක්ෂිත පිරිවැයට පසුකාලීනව ගණනය කෙරේ. බැරකම් නොපිළිගන්නා විට මෙන්ම සක්‍රීය පොලී අනුපාත ක්‍රම ක්‍රමක්ෂය ක්‍රියාදාමය (EIR) හරහා වාසි හා පාඩු ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. EIR හි අත්‍යාවශ්‍ය කොටසක් වන අත්පත් කර ගැනීමේ වට්ටම හෝ වාරික සහ ගාස්තු හා පිරිවැය ඇත්නම් ඒවා සැලකිල්ලට ගෙන ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය තුල අන්තර්ගතව ඇත.

**නොපිළිගැනීම**

බැරකමක් යටතේ ඇති බැඳීමක් මුදාහැර හෝ අවලංගු කර හෝ කල් ඉකුත්වී ඇති අවස්ථාවක මූල්‍ය බැරකමක් නොපිළිගැනේ.

පවතින මූල්‍ය බැරකමක් එම ණයකරු විසින්ම වෙනස් පසුකාලීන කොන්දේසි, හෝ පසුකාලීනව සංශෝධනය කළ කොන්දේසි මත පවත්නා බැරකම මත හිලව් කිරීමේදී එවන් මාරුකිරීමක් හෝ සංශෝධනයක් මූලික බැරකමේ නොපිළිගැනීමක් ලෙස හා නව බැරකම පිළිගැනීමක් සේ සලකන අතර අදාළ ධාරන අගයන්හි වෙනස ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

iii) **මූල්‍ය උපකරණ හිලව් කිරීම**

පිළිගත් මුදල් හිලව් කිරීමට තත්කාලීන බලාත්මක නෛතික හිමිකමක් අනිවාර්යයෙන්ම තිබේනම් හා ශුද්ධ පදනම මත, එසේ නැතහොත් වත්කම ලබා ගැනීමට හා බැරකම එකම අවස්ථාවකදී පියවීමට අදහසක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සඳහන් කෙරේ.





# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

iv) **මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම**

එක් එක් දන්වා සිටින දිනට සක්‍රීය වෙළෙඳපොළවල්හි අලෙවි වන මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම මිලගණන් කැඳවූ වෙළෙදපොළ මිලගණන් හෝ අලෙවි මිල ගණන් කැදවීම් (දිගු තත්වයන්ට ලංසු මිල හා ඉල්ලන මිල කෙටි තත්වයන්ට) වලට අදාළව තීරණය වේ.

පවතින වෙළෙඳපොළේ අලෙවි නොවූ මූල්‍ය උපකරණ සඳහා සාධාරණ අගය සුදුසු තක්සේරු ක්‍රමවේද මත තීරණය කෙරේ. එවැනි ක්‍රමවේද අතර සැලකිය යුතු ලෙස සමාන වන වෙනත් උපකරණයක, වට්ටම් කළ මුදල් ගලන විමසුම හෝ වෙනත් වටිනාකම් ආකාරයකට අදාළ තථ්‍ය සාධාරණ වටිනාකම සමීප අලෙවි ගනුදෙනු භාවිත කිරීම අඩංගු විය හැකිය.

**2.7.18 මූල්‍ය නොවන වත්කම් අපවයවීම**

කිසියම් වත්කමක් දන්වා සිටින එක් එක් දිනට අපවයවීමක් පෙන්නුම් කරන්නේ දැයි සමූහ ව්‍යාපාරය පරීක්ෂා කරනු ලැබේ. එවැනි ලක්ෂණ පෙන්නුම් කර ඇති අවස්ථාවක, හෝ වත්කමකට අදාළව වාර්ෂික අපවයවීමේ පරීක්ෂාවක් අවශ්‍ය වන්නේනම්, වත්කමේ අයකරගත හැකි මුදල සමූහ ව්‍යාපාරය ඇස්තමේන්තු කෙරේ. වත්කමක අයකරගත හැකි මුදල යනු වත්කමේ හෝ විකිණීමට ඇති මුදල් ජනනය කරන ඒකකයේ (CGU) පිරිවැය නොමැති සාධාරණ වටිනාකම සහ එහි භාවිත වටිනාකම යන ඒවායින් වැඩි එකය. එය වෙනත් වත්කම් හෝ සමූහ ව්‍යාපාරයේ වත්කම්වලින් දැඩි ලෙස නිදහස් මුදල් ගලන උපයන වත්කම් හැර එක් හුදකලා වත්කමකට අදාළව තීරණය වේ. වත්කමක හෝ CGU හි ධාරන අගය එහි අයකරගත හැකි මුදල ඉක්මවන අවස්ථාවකදී, වත්කම අපවයවී ඇති බවට සලකා එහි අයකළ හැකි මුදලට ලියා හැරේ. භාවිතාවේ ඇති වටිනාකම තක්සේරු කිරීමේ දී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලන ඒවායේ තථ්‍ය වටිනාකමට මුදල් වල කාලීන අගයේ තථ්‍ය වෙළෙඳපොළ තක්සේරු හුවා දක්වන හා වත්කමට අදාළ අවදානම සලකා බදු පූර්ව වට්ටම් අනුපාතයක් භාවිතා කර වට්ටම් කෙරේ. විකුණුම් පිරිවැය අඩු කර සාධාරන වටිනාකම තීරණය කිරීමේදී මෑතක සිදු වූ වෙලදපල ගනුදෙනු සැලකිල්ලට ලක් කෙරේ. එවැනි කිසිදු ගනුදෙනුවක් හදුනාගත නොහැකි අවස්ථාවක සුදුසු ඇගයීමේ ක්‍රමවේදයක් භාවිතා කෙරේ. මෙම ගණනය කිරීම් ඇගයුම් ගුණාකාර, ප්‍රසිද්ධියේ වෙන්දේසි කළ උප ආයතනවල මිලගනන් කැදවූ කොටස් මිල හෝ වෙනත් සාධාරණ වටිනාකම් දර්ශක මගින් තහවුරු කෙරේ.

තොග අපවයවීම ඇතුළුව අඛණ්ඩ මෙහෙයුම්වල අපවයවීමේ පාඩු ආදායම් ප්‍රකාශනයේ ඒවායේ වියදම්වර්ග වලින් වෙනත් විස්තීරණ ආදායමට ප්‍රතිඇගයුම ගෙන ගිය මීට පෙර ප්‍රතිඇග යුම් කළ දේපලක් හැර අපවය වූ වත්කමේ කාර්ය සමග හදුනා ගැනේ. මෙහිදී, වෙනත් විස්තීරණ ආදායම තුළ පූර්ව ප්‍රතිඇග යුම් මුදලක් ඇතොත් ඒ දක්වා අපවයවීම ද හදුනා ගැනේ.

කීර්තිනාමය හැර වත්කම්වලට අදාළව පූර්වව හදුනාගත් අපවයවීමේ පාඩු තවදුරටත් තිබෙන බවට හා ඒවා අඩු වී ඇති බවට සාක්ෂ්‍ය ඇත්දැයි පරීක්ෂා කිරීමට දන්වා සිටින එක් එක් දිනට තක්සේරුවක් සිදු කෙරේ. එවැනි ලක්ෂණ පෙන්නුම් කර ඇති අවස්ථාවකදී, වත්කමේ හෝ මුදල් ජනන ඒකකයේ අයකරගත හැකි මුදල සමූහ ව්‍යාපාරය විසින් ඇස්තමේන්තුගත කෙරේ.

අවසාන අපවයවීමේ පාඩුව හදුනාගෙන ඇති විටෙක වත්කමේ අයකරගත හැකි මුදල තීරණය කිරීමට යොදාගන්නා උපකල්පනවල වෙනසක් ඇති අවස්ථාවකදී පමණක් කලින් හදුනාගත් අපවයවීමේ පාඩු වෙනස් කිරීමට කටයුතු කෙරේ. වත්කමේ ධාරන මුදල එහි අයකරගත හැකි මුදලට ඉක්මවා නොයන ලෙසත් තිරණය කරනු ලබන ධාරන අගයට ඉක්මවා නොයන ලෙසත් පූර්වවසර වල වත්කමෙහි කිසිදු අපවයවීමේ පාඩුව හදුනා නොගැනීම මත වෙනස් කිරීම සීමාසහිත වේ. ප්‍රතිඇගයුම් වැඩිවීම ලෙස වෙනසේ දී සැලකෙන වත්කමෙහි ප්‍රතිඇගයුම් මිලට එවැනි වෙනසක් ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

**2.7.19 මුදල් හා කෙටිකාලීන තැන්පතු**

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ඇති මුදල් හා කෙටිකාලීන තැන්පත් තුළ බැංකුගත මුදල්, අතැති මුදල් හා මාස තුනකින් හෝ ඊට අඩු කලකින් කල් පිරෙන කෙටිකාලීන තැන්පත් අඩංගු වේ.

සමූහ ව්‍යාපාරයේ මුදල් ගලන ප්‍රකාශනය, මුදල් හා මුදල්වලට සමාන දෑ තුළ හිඟව ඇති බැංකු අයිරා හැර උක්ත සඳහන් කර ඇති මුදල් හා කෙටිකාලීන තැන්පත් අන්තර්ගත වේ.

**2.7.20 ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහ ව්‍යාපාරයට තථ්‍ය බැඳීමක් (නෛතික හෝ හිතකර) ඇති අවස්ථාවල ප්‍රතිපාදන හඳුනාගෙන ඇත. බැදීමක් පියවීම සදහා ආර්ථික ප්‍රතිලාභ අඩංගු සම්පත් පිටතට ගලායාමක් අවශ්‍යවීමේ හැකියාව ඇති අතර, බැදීමේ අගයට පිළිගත හැකි ඇස්තමේන්තුවක් සැකසිය හැකිය. සමූහ ව්‍යාපාරය එයම එසේ නැතහොත් මුළු ප්‍රතිපාදනයම ප්‍රතිපූර්ණවීම අපේක්ෂා කරන අවස්ථාවක උදාහරනයක් වශයෙන් රක්ෂණ කොන්ත්‍රාත්තුවක් යටතේ ප්‍රතිපූර්ණය ස්ථිර එකක් නම් පමණක් වෙනම වත්කමක් ලෙස ප්‍රතිපූර්ණය හදුනා ගැනේ. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වියදම ප්‍රතිපූර්ණයකින් තොරව ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කෙරේ.

මුදල්වල කාලීන වටිනාකමේ බලපෑම තීරණාත්මක වන අවස්ථාවකදී, තථ්‍ය පූර්ව බදු අනුපාත භාවිත කර අවස්ථානුකූලව බැරකමට අදාළ අවදානම් අනුව ප්‍රතිපාදන වට්ටම් කෙරේ. වට්ටම් ලබාදීම යොදවා ගැනීමේදී කාලය ගතවීම නිසා ඇති කරන ප්‍රතිපාදන වැඩිවීම මූල්‍ය පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

**2.7.21 විශ්‍රාම ප්‍රතිලාභ බැරකම්**

**(a) ස්ථිර දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල**

අදාළ රෙගුලාසි හා ව්‍යවස්ථාවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකත්වයන් සඳහා සේවකයෝ සුදුසුකම් ලබති. සමාගම විසින් 15% ක් හා සේවකයාගේ දළ පාරිශ්‍රමිකයකින් 3% ක් පිළිවෙළින් සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකත්වයන් ලබා දේ.

**ස්ථිර ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂකය**

ස්ථිර ප්‍රතිලාභ සැලැස්මක් වන පාරිතෝෂික වල ප්‍රකාශිත විශ්‍රාමික ප්‍රතිලාභවල තථ්‍ය අගය යෝජිත ප්‍රතිලාභ ඇගයීමේ ක්‍රමය භාවිත කර ආයුඝණකයක් මගින් සමාගම විසින් ගණනය කෙරේ. ස්ථිර ප්‍රතිලාභ සැලසුම් වල ආයුඝණක වාසි හා පාඩු වෙනත් විස්තීරණ ආදායම් ඒවා ඇති වූ මූල්‍ය වසරේ ආදායමක් හෝ වියදමක් ලෙස හදුනා ගෙන ඇත.

කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ ගෙවීම් වලට අනුව මෙම බැරකම අඛණ්ඩ පස් වසරක සේවා කාලය සැපිරීම මත පමණක් ඇති වේ.

පාරිතෝෂිත බැරකම් සඳහා අභ්‍යන්තරිකව අරමුදල් සපයා නොමැත.

**2.7.22 පාරිභෝගික දායකත්ව මත විලම්බිත ආදායම**

නව සේවා සබඳතා ලබා ගැනීමට පාරිභෝගිකයන්ට දැරීමට වන වත්කම් පිරිවැය විලම්බිත බැඳීම් ලෙස හදුනා ගැනේ. නව සේවා සබඳතා වත්කම් වසර 20 ක කාලයක් පුරා ක්ෂය වීමට ලක් වේ. අදාළ පාරිභෝගික දායකත්වයන් සමාන වසර 20 ක කාලයක් තුළ ආදායම් ප්‍රකාශනයේ ක්‍රමක්ෂය කෙරේ.

**2.8 නිකුත්කළ එහෙත් සක්‍රීය නොවූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලින් එල්ලවන බලපෑම**

අනාගතයේ සිට ක්‍රියාත්මක වන දිනය දක්වා ඇති හා මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමට අදාළ නොවන පහත දැක්වෙන SLFRS ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇත. එකී SLFRS සමාගම මේ වන විට අනුගමනය කරන ගිණුම් ප්‍රතිපත්තිවලට බලපෑමක් එල්ල කරන අතර අනාගත මූල්‍ය ප්‍රකාශන කෙරෙහිද බලපෑමක් ඇති කිරීමට හැකියාව ඇත.

**(i) SLFRS 9 - මූල්‍ය උපකරණ: වර්ගීකරණය හා ගණනය කිරීම**

2014 වසරේ දෙසැම්බර් මසදී CA ශ්‍රී ලංකා විසින් මූල්‍ය උපකරණ යෝජනා ක්‍රමයේ සියලු පැතිකඩ හුවා දක්වන SLFRS 9 මූල්‍ය උපකරණවල අවසන් අනුවාදය නිකුත් කෙරුණ අතර, එහි LKRS 39 මූල්‍ය උපකරණ, පිළිගැනීම හා ගණනය කිරීම ඉවත් කර අවශ්‍ය වෙනස් කම් කර ඇත. ප්‍රමිතිය මගින් වර්ගීකරණය හා මැනීමේ අපවයවීම සහ හෙජ් ගිණුම් සැකසීමට අවශ්‍ය කරන නව ක්‍රමවේද අඩංගු කර ඇත.

2018 ජනවාරි 01 දින හෝ ඊට පසුව ඇරඹෙන වාර්ෂික කාලසීමා වලට කලින් යෙදවුම් මත SLFRS 9 අදාළ වේ.

අතීතානුයෝගි භාවිතාව අවශ්‍ය වුවද ප්‍රමාණවාචික තොරතුරු අනිවාර්ය නොවේ.

SLFRS 9 භාවිත කිරීම මගින් සමූහ ව්‍යාපාරයේ මූල්‍ය වත්කම් වර්ගීකරණයට හා ගණනය කිරීමේදී බලපෑමක් ඇති විය හැකි වුවද, සමාගමේ මූල්‍ය බැරකම් වර්ගීකරණයට හා ගණනය කිරීමට කිසිදු බලපෑමක් ඇති නොකෙරේ.

**(ii) SLFRS 15 - පාරිභෝගිකයන් සමග කොන්ත්‍රාත්වලින් ලැබෙන ආදායම**

ආදායමේ ප්‍රමාණය හා කාල වකවානුව සදහන් කිරීම හඳුනා ගන්නා ආකාරය තිරණය කිරීමේ දි විස්තීරණ ව්‍යුහයක් SLFRS 15 මගින් සපයා දේ. මෙමගින් LKAS 18 ආදායම, LKAS 11 ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සහ IFRIC 13 පාරිභෝගික විශ්වාසදායී වැඩසටහන් ඇතුළුව දැනට පවත්නා ආදායම් හදුනාගැනීමේ මාර්ගෝපදේශය විස්ථාපනය කෙරේ. 2018 ජනවාරි 01 දින හෝ ඉන් අනතුරුව ආරම්භ වන වාර්ෂික කාල වකවානු සදහා මෙම ප්‍රමිතිය අදාළ වේ.

මෙම ප්‍රමිති ක්‍රියාත්මක තලය වන විට සමාගම ඒවා අනුගමනය කරනු ලැබේ. විස්තරාත්මක විමර්ශනයක් ඉටු කිරීමකට යටත්ව මෙම මූල්‍ය ප්‍රකාශන පළ කරන දිනට මූල්‍යමය ප්‍රතිඵල නියම ලෙස ඇස්තමේන්තු කල නොහැකිය.





# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

**3. දේපල, පිරියත හා උපකරණ**

| | සමූහ ව්‍යාපාර | ශේෂය දිනට 01.01.2015 රු.'000 | එකතුකිරීම්/ මාරුකිරීම් රු.'000 | ඉවත්කිරීම්/ මාරුකිරීම් රු.'000 | ශේෂය දිනට 31.12.2015 රු.'000 |
|---|---|---|---|---|---|
| 3.1 | **දළ ධාරන අගය** | | | | |
| 3.1.1 | **පිරිවැයට** | | | | |
| | මෝටර් රථ | 878,962 | 22,894 | (58,667) | 843,189 |
| | පරිගණක | 296,892 | 63,851 | - | 360,743 |
| | කාර්යාලීය උපකරණ | 366,640 | 20,823 | (3,938) | 383,525 |
| | පිරියත හා යනත්‍රෝපකරණ | 89,754 | 470 | - | 90,224 |
| | යටිතල පහසුකම් සැලසීම | 20,098,790 | 669,494 | (54,586) | 20,713,698 |
| | | **21,731,037** | **777,532** | **(117,191)** | **22,391,379** |
| | **තක්සේරුවේදී** | | | | |
| | සින්නක්කර ඉඩම් | 1,687,032 | 71,912 | - | 1,758,944 |
| | ගොඩනැගිලි | 623,045 | 43,853 | - | 666,898 |
| | | **2,310,077** | **115,765** | **-** | **2,425,842** |
| | **මුළු දළ වත්කම් ධාරණ අගය** | **24,041,114** | **893,297** | **(117,191)** | **24,817,221** |

| 3.1.2 | **ඉදිකිරීම් අතරතුර** | ශේෂය දිනට 01.01.2015 රු.'000 | එකතුකිරීම් රු.'000 | මාරුකිරීම් රු.'000 | ශේෂය දිනට 31.12.2015 රු.'000 |
|---|---|---|---|---|---|
| | යටිතල පහසුකම් සැපයීම | 561,369 | 821,480 | (950,981) | 431,868 |
| | | 561,369 | 821,480 | (950,981) | 431,868 |
| | **මුළු දල ධාරන මුදල** | **24,602,483** | **1,714,777** | **(1,068,172)** | **25,249,088** |

| 3.1.3 | **ක්ෂයවීම්** | ශේෂය දිනට 01.01.2015 රු.'000 | වසරේ බැරකිරීම් රු.'000 | ඉවත්කිරීම්/ මාරුකිරීම් රු.'000 | ශේෂය දිනට 31.12.2015 රු.'000 |
|---|---|---|---|---|---|
| | **පිරිවැයට** | | | | |
| | මෝටර් රථ | 463,017 | 94,651 | (58,332) | 499,336 |
| | පරිගණක | 245,549 | 16,574 | - | 262,123 |
| | කාර්යාලීය උපකරණ | 267,517 | 23,832 | (3,914) | 287,435 |
| | පිරියත හා යන්ත්‍රෝපකරණ | 65,283 | 7,240 | - | 72,523 |
| | යටිතල පහසුකම් සැලසීම | 12,646,145 | 719,687 | (29,467) | 13,336,365 |
| | | **13,687,511** | **861,985** | **(91,713)** | **14,457,783** |
| | **තක්සේරුවේදී** | | | | |
| | ගොඩනැගිලි | 602 | 16,096 | - | 16,698 |
| | | **602** | **16,096** | **-** | **16,698** |
| | **සමස්ත අගය අඩුවීම** | **13,688,112** | **878,081** | **(91,713)** | **14,474,481** |

# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

**3. දේපල, පිරියත හා උපකරණ (දිගුව...)**

**සමූහ ව්‍යාපාරය**

**3.1.4 ශුද්ධ පොත් වටිනාකම**

| | 2015<br>රු.'000 | 2014<br>රු.'000 |
|---|---|---|
| **පිරිවැයට** | | |
| මෝටර් රථ | 343,853 | 415,945 |
| පරිගණක | 98,620 | 51,343 |
| කාර්යාලීය උපකරණ | 96,090 | 99,123 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 17,701 | 24,471 |
| යටිතල පහසුකම් සැලසීම | 7,377,333 | 7,452,645 |
| | **7,933,597** | **8,043,527** |
| **තක්සේරුවේදී** | | |
| **සින්නක්කර ඉඩම්** | 1,758,944 | 1,687,032 |
| ගොඩනැගිලි | 650,200 | 622,443 |
| | **2,409,144** | **2,309,475** |
| **ප්‍රාග්ධන කාර්යය ප්‍රගතිය** | | |
| යටිතල පහසුකම් සැපයීම | 431,868 | 561,369 |
| | **431,868** | **561,369** |
| **දේපල, පිරියත හා උපකරණ වල මුළු ශුද්ධ ධාරන අගය** | **10,774,609** | **10,914,371** |

**3. දේපල, පිරියත හා උපකරණ**
**සමූහ ව්‍යාපාරය**

**3.2 දළ ධාරන අගය**

**3.2.1 පිරිවැයට**

| | දිනට ශේෂය 01.01.2015<br>රු.'000 | බැරකිරීම්/ මාරුකිරීම්<br>රු.'000 | ඉවත්කිරීම්/ මාරුකිරීම්<br>රු.'000 | දිනට මාරුකිරීම් 31.12.2015<br>රු.'000 |
|---|---|---|---|---|
| මෝටර් රථ | 874,354 | 22,894 | (58,667) | 838,581 |
| පරිගණක | 295,690 | 62,972 | - | 358,662 |
| කාර්යාලීය උපකරණ | 364,365 | 20,689 | (3,919) | 381,135 |
| යටිතල පහසුකම් සැපයීම | 20,098,790 | 669,494 | (54,586) | 20,713,698 |
| | **21,633,199** | **776,049** | **(117,172)** | **22,292,076** |
| **තක්සේරුවේදී** | | | | |
| සින්නක්කර ඉඩම් | 1,687,032 | 49,883 | - | 1,736,915 |
| ගොඩැනැගිලි | 623,045 | 2,601 | - | 625,646 |
| | **2,310,077** | **52,484** | **-** | **2,362,561** |
| **වත්කම්වල දළ ධාරන අගය** | **23,943,276** | **828,533** | **(117,172)** | **24,654,637** |





# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

**3. දේපල, පිරියත හා උපකරණ (දිගුව...)**

**සමාගම**

**3.2.2 ඉදිකිරීම් අතරතුර**

| | දිනට ශේෂය 01.01.2015<br>රු.'000 | බැරකිරීම්<br>රු.'000 | මාරුකිරීම්<br>රු.'000 | දිනට ශේෂය 31.12.2015<br>රු.'000 |
|---|---|---|---|---|
| යටිතල පහසුකම් සැලසීම | 563,820 | 822,062 | (950,981) | 434,901 |
| | **563,820** | **822,062** | **(950,981)** | **434,901** |
| **දළ ධාරන අගයේ එකතුව** | **24,507,096** | **1,650,595** | **(1,068,153)** | **25,089,538** |

**3.2.3 ක්ෂයවීම**

| | දිනට ශේෂය 01.01.2015<br>රු.'000 | වසරේ බැරකිරීම්<br>රු.'000 | ඉවත්කිරීම්/ මාරුකිරීම්<br>රු.'000 | දිනට ශේෂය 31.12.2015<br>රු.'000 |
|---|---|---|---|---|
| **පිරිවැය අගයට** | | | | |
| මෝටර් රථ | 461,047 | 93,729 | (58,314) | 496,462 |
| පරිගනක | 244,721 | 16,213 | - | 260,934 |
| කාර්යාල උපකරණ | 265,506 | 23,480 | (3,914) | 285,072 |
| යටිතල පහසුකම් සැලසීම | 12,646,614 | 719,687 | (29,467) | 13,336,834 |
| | **13,617,888** | **853,109** | **(91,695)** | **14,379,302** |
| **තක්සේරුවේදී** | | | | |
| ගොඩනැගිලි | 252 | 15,586 | - | 15,838 |
| | **252** | **15,586** | **-** | **15,838** |
| **සමස්ත ක්ෂයවීම්** | **13,618,140** | **868,695** | **(91,695)** | **14,395,140** |

**3.2.4 ශුද්ධ පොත් අගය**

| | 2015<br>රු.'000 | 2014<br>රු.'000 |
|---|---|---|
| **රිවැයට** | | |
| මෝටර් වාහන | 342,119 | 413,307 |
| පරිගණක | 97,728 | 50,969 |
| කාර්යාලීය උපකරණ | 96,063 | 98,859 |
| යටිතල පහසුකම් සැපයීම | 7,376,864 | 7,452,176 |
| | **7,912,774** | **8,015,311** |
| **තක්සේරුවේදී** | | |
| සින්නක්කර ඉඩම් | 1,736,915 | 1,687,032 |
| ගොඩනැගිලි | 609,807 | 622,793 |
| | **2,346,722** | **2,309,825** |
| **ප්‍රාග්ධන කාර්ය ප්‍රගතිය** | | |
| යටිතල පහසුකම් සැපයීම | 434,901 | 563,820 |
| | **434,901** | **563,820** |
| **දේපල, පිරියත හා උපකරණවල සමස්ත ශුද්ධ ධාරන මුදල** | **10,694,398** | **10,888,956** |

# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

**3.** **දේපල, පිරියත හා උපකරණ (දිගුව...)**

ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ වටිනාකම අවසාන වශයෙන් තීරණය වන්නේ 2014 දෙසැම්බර් 31 මූල්‍ය වර්ෂය තුළ ප්‍රතිප්‍රමාණනයක් මගින් අවසාන වශයෙන් තීරණය වේ. ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමේ වසර 30 ට අධික අත්දැකීම් ඇති පිළිගත් ස්වාධීන තක්සේරුකරුවෙකු වන පී.පී.ටී. මොහිදීන් මහතා විසින් තක්සේරු කිරීම් සිදු කර ඇත. ඉඩම් හා ගොඩනැගිලිවල සාධාරණ වටිනාකම වෙළඳපල සංසන්දනාත්මක ක්‍රමය භාවිත කර ගණනය කර ඇත. ඉන් අදහස් කරන්නේ තක්සේරුකරු විසින් කරන තක්සේරු විශේෂිත දේපලේ ස්වභාවය, පිහිටීම හෝ තත්වයට අදාළ වෙනස්කම් වල සැලකිය යුතු ලෙස ගැලපුම් කර පවත්නා වෙළඳපොළ මිල අනුව සිදු වේ. 2015 දෙසැම්බර් 31 දිනය වන විට ඇති ධාරණ අගයන් සාධාරණ අගයන්ගෙන් ද්‍රව්‍යාත්මකව වෙනස් නොවේ.

| **ප්‍රධාන නිරීක්ෂණය නොවන තක්සේරු යෙදවුම්** | **පරාසය** | | |
|---|---|---|---|
| | | ඉඩම: පර්චසයක මිල | රු.125,000 - රු.4,000,000 |
| ගොඩනැගිල්ල: වර්ග මීටරයක මිල | රු.100 - රු.7450 | | |

සමාගමේ ඉඩම් හා ගොඩනැගිලි කැලණිය, කළුතර, නුගේගොඩ, මොරටුව, නාරාහේන්පිට, මීගමුව, ගාල්ල, කෝට්ටේ, නුවරඑළිය, වස්කඩුව, ඒකල, ජාඇල, හික්කඩුව, පෑලියගොඩ, රාජගිරිය, අම්බලන්ගොඩ, බණ්ඩාරගම හා මහරගම පිහිටා ඇත.

හුදකලාව ඇති වර්ග මීටරයක ඇස්තමේන්තුගත මිලේ ප්‍රධාන වැඩිවීම් (අඩුවීම්) මගින් සැලකිය යුතු වැඩි (අඩු) සාධාරණ වටිනාකමක් ඇති කරවයි.

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වී ඇති ප්‍රතිතක්සේරුකළ වත්කම්වල ධාරන අගයන් තුළ පහත පරිදි පිරිවැය අඩු ක්ෂයට කළ වත්කම් අඩංගු වේ.

| වත්කම් වර්ගය<br>රු.'000 | පිරිවැය<br>පිරිවැය | සමුච්චිත පිරිවැය<br>පිරිවැය<br>රු.'000 | ශුද්ධ ධාරන<br>2015<br>රු.<br>රු.'000 | පිරිවැය<br>ශුද්ධ ධාරන<br>රු.'000 | සමුච්චිත<br>අගය<br>රු.'000 | වත්කම්<br>පිරිවැයට<br>2014<br>රු.<br>රු.'000 |
|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | 320,143 | 100,386 | 219,757 | 317,542 | 92,382 | 225,160 |
| ඉඩම් | 582,942 | - | - | 533,059 | - | 533,059 |
| | **903,085** | **100,386** | **219,757** | **850,601** | **92,382** | **758,219** |

**3.4** මූල්‍ය වර්ෂය තුළදී, රු. මිලියන 915.9 ක් (2014 - රු. මිලි. 1,106) මුළු වටිනාකම ඇති දේපල, පිරියත හා උපකරණ සමාගම සතු කරගෙන ඇත. දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා වසර තුළදී රු. මිලි. 834 (2014 - රු. මිලි. 1106) මුදල් ගෙවීමක් සිදු කර තිබුණි.

**3.5** **වත්කම් වල භාවිත ආයුකාලය පහත පරිදි වේ.**

| | **2015** | **2014** |
|---|---|---|
| ගොඩනැගිලි | 2.5% | 2.5% |
| **යටිතල පහසුකම් සැලසීම** | | |
| උප පොලවල්, උඩු රැහැන් සහ ලෙකෝ විසින් ඉදිකළ සේවා රැහැන් | 4% - 5% p.a. | 4% - 5% p.a. |
| මෝටර් රථ | 15% p.a. | 15% p.a. |
| පරිගණක | 20% p.a. | 20% p.a. |
| කාර්යාලීය උපකරණ | 15% p.a. | 15% p.a. |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 25% p.a | 25% p.a |

**3.6** සමාගමේ දේපල, පිරියත හා උපකරණ රු. මිලි. 614.4 (2014 - රු. මිලි. 550) ක දළ ධාරන අගයක් ඇති පූර්ණ ලෙස ක්ෂය වූ වත්කම්වලින් සමන්විත වේ.

**3.7** ඇතුල්කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 953/1 හි පිහිටි ඉඩමක් ඇතුළුව සමාගමේ ඉඩම්වල රු. මිලියන 69.5 ක ධාරණ වටිනාකමක් ඇත.

2014 ජූලි 01 දිනැති 1869/7 ගැසට් නිවේදනයට අනුව, පොදු කටයුතු සඳහා උක්ත ඉඩම අත්පත් කර ගැනීමට රජය බලාපොරොත්තු වන බව ඉඩම් අත්පත් කර ගැනීමේ දැන්වීම් වල සඳහන් කර තිබේ.

විකල්ප ඉඩමක් ලබා දෙන ලෙස හෝ ඊට සමාන වෙළෙඳපොළ වටිනාකම දෙන ලෙස කළමනාකාරිත්වය ඉල්ලා ඇති අතර ඒ සඳහා අවසන් තීරණය මෙතෙක් ලබා දීමට නියමිතව ඇත.





# මූල්‍ය ප්‍රකාශනවල සටහන්
## 2015 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය

**4.** **ආයෝජිත දේපල**
**(සමාගම)**

| | **2015**<br>**රු.'000** |
|---|---|
| ජනවාරි 01 දිනට | - |
| වසර තුළ එකතුවීම් | 63,281 |
| දෙසැම්බර් 31 දින | (510) |
| ක්ෂයවීම් | **62,771** |

4.1 අදාළ වසර තුළදී රු. මිලියන 63.2 ක ආයෝජන දේපල (ඉඩම් හා ගොඩනැගිලි) සමාගම ලබා ගෙන ඇති අතර රු. මිලි. 41.2 වටිනා ගොඩනැගිලි ඒවායේ භාවිත ආයු කාලය වන වසර 40 ට වඩා ක්ෂය වී ඇත.

4.2 මෙම ආයෝජන දේපලේ සාධාරණ වටිනාකම දන්වා සිටින දිනට එහි ධාරන වටිනාකමට සමාන වන බව කළමනාකාරිත්වය විශ්වාස කරයි.

**5.** **අප්පෑෂ්ඨ වත්කම්**

| **(සමූහ ව්‍යාපාරය)**<br>**පිරිවැයට** | **දිනට ශේෂය 01.01.2015 රු.'000** | **එකතුවීම් රු.'000** | **ඉවත්කිරීම්** | **දිනට ශේෂය 31.12.2015 රු.'000** |
|---|---|---|---|---|
| තාක්ෂණික දැනුම (චීනයෙන්) | 27,500 | - | - | 27,500 |
| | 27,500 | - | - | 27,500 |
| **ක්‍රමක්ෂය** | | | | |
| තාක්ෂණික දැනුම (චීනයෙන්) | 11,000 | 1,833 | - | 12,833 |
| | 11,000 | 1,833 | - | 12,833 |
| **ශුද්ධ පොත් වටිනාකම** | | | | |
| තාක්ෂණික දැනුම (චීනයෙන්) | 16,500 | | | 14,667 |
| | **16,500** | | | **14,667** |

**6.** **සමකොටස් ආරක්ෂිතවල තැන්පත්කිරීම්**

| **(සමාගම)**<br>**උප සමාගම් වල ආයෝජන** | **Holding %**<br>**2015** | **2014** | **කොටස් ප්‍රමාණය**<br>**2015** | **2014** | **ධාරන අගය 2015**<br>**රු.000** | **ධාරන අගය 2014**<br>**රු.00** |
|---|---|---|---|---|---|---|
| සී/ස ලෙකෝ ප්‍රොජෙක්ට්ස් (පෞද්.) සමාගම - සාමාන්‍ය කොටස් | 100% | 100% | 2,500,100 | 2,500,100 | 25,001 | 25,001 |
| ලෙකෝ මීටරින් (පෞද්.) සමාගම - සාමාන්‍ය කොටස් | 70% | 70% | 3,131,967 | 3,131,967 | 31,320 | 31,320 |
| අඩු කළා: අපවයවීම් වෙන් කිරීම් | | | | | (25,001) | (25,001) |
| | | | | | **31,320** | **31,320** |

**7.** **වෙනත් මූල්‍ය වත්කම්**

| | **සමූහ ව්‍යාපාරය**<br>**2015**<br>**රු.000** | **2014**<br>**රු.000** | **සමාගම**<br>**2015**<br>**රු.000** | **2014**<br>**රු.000** |
|---|---|---|---|---|
| **ණය හා ලැබීමට ඇති දෑ (7.1)** | | | | |
| භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලන ඉල්ලා ගැනීම් | 570,000 | 570,000 | 570,000 | 570,000 |
| සමාගමේ නිලධාරී ණය | 795,328 | 512,943 | 795,329 | 512,943 |
| | **1,365,328** | **1,082,943** | **1,365,329** | **1,082,943** |
| ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉල්ලා ගත් දෑ (7.1.1) | - | 2,265,000 | - | 2,265,000 |
| | **-** | **2,265,000** | **-** | **2,265,000** |
| ආයෝජන - කාල තැන්පතු | 170,391 | 962,847 | 170,391 | 962,847 |
| බැංකු ආයෝජන - සේවක ණය | 841,398 | 815,038 | 841,398 | 815,038 |
| ආයෝජන - වෙනත් තැන්පත් | 2,082,551 | 1,447,215 | 1,900,000 | 1,300,000 |
| | **3,094,340** | **3,225,100** | **2,911,789** | **3,077,885** |

**අලෙවි ආයෝජන සඳහා තබා ඇති (7.2)**

| **මිලගණන් නොකැදවූ සමකොටස් ආයෝජන** | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| සී/ස ලංකා බ්‍රෝඩ් බෑන්ඩ් නෙට්වර්ක් (පෞද්.) සමාගම - සාමාන්‍ය කොටස් | 4% | 4% | 500,000 | 500,000 | 5,000 | 5,000 | 15,000 | 5,000 |
| - ප්‍රමුඛතා කොටස් | 100% | 100% | 1,500,000 | 1,500,000 | 15,000 | 15,000 | 5,000 | 15,000 |
| සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පෞද්.) සමාගම - සාමාන්‍ය කොටස් | 18.18% | 18.18% | 20,000,000 | 20,000,000 | 8,095,739 | 8,281,953 | 8,095,739 | 8,281,953 |
| අඩු කළා: අපවයවීමේ ආයෝජන | | | | | (20,000) | (20,000) | (20,000) | (20,000) |
| | | | | | **8,095,739** | **8,281,953** | **8,095,739** | **8,281,953** |
| **කොටස් සදහා අත්තිකාරම්** | | | | | | | | |
| සී/ස ඇන්ටෙ ලෙකෝ මීටරින් (පෞද්.) සමාගම - කොටස් සඳහා අයදුම් කිරීම | | | | | - | - | 47,085 | 47,085 |
| | | | | | **-** | **-** | **47,085** | **47,085** |
| **සමස්ත වෙනත් මූල්‍ය වත්කම** | | | | | | | | |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | | | | | 8,937,137 | 9,666,991 | 8,984,222 | 9,714,076 |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම් | | | | | 3,618,270 | 5,188,005 | 3,435,720 | 5,040,790 |
